මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

இலங்கை தேசிய மனிதவள அபிவிருத்தி சபை

NATIONAL HUMAN RESOURCES DEVELOPMENT COUNCIL OF SRI LANKA

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# ANNUAL REPORT

# 2019

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය

**Ministry of National Policies, Economic Affairs, Resettlement & Rehabilitation, Northern Province Development and Youth Affairs**

**தேசிய கொள்கைகள், பொருளாதார விவகாரங்கள், மீள்குடியேற்றும் மற்றும் புனர்வாழ்வு, வடமாகாண அபிவிருத்தி, தொழிற்பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சு**

354/2, නිපුණතා පියස, 7 වන මහල, ඇල්විටිගල මාවත, කොළඹ 05

354/2, 7 ஆம் மாடி, நிபுனதா பியச, எல்விட்டிகெல மாவத்தை, கொழும்பு - 05

354/2, NIPUNATHA PIYASA, 7TH FLOOR, ELVITIGALA MAWATHA, COLOMBO 05.

# ආයතනික පසුබිම

| | | |
|---|---|---|
| ආයතනය | : | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| අමාත්‍යාංශය | : | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය |
| ලිපිනය | : | 354/2, 7 වන මහල, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 |
| ඊ මේල් ලිපිනය | : | director.nhrdc@yahoo.com |
| වෙබ් අඩවිය | : | www.nhrdc.gov.lk |
| දුරකථන අංකය | : | 0112595679 |
| ෆැක්ස් | : | 0112595680 |
| බැංකු කරුවන් | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව |

## දර්ශනය

අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්

## මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## අගයන්

- සාමූහිකත්වය
- නිර්මාණශීලිත්වය
- පාරිභෝගික නැඹුරුතාව
- සමානාත්මතාව

## සභාපතිතුමාගේ ප්‍රකාශය

තනි පුද්ගල, ආයතනික මෙන්ම ජාතික මට්ටමින්, පුහුණු හා යාවජීව අධ්‍යයන සංස්කෘතියක් පිණිස උනන්දුව ඇති කිරීමේ අරමුණින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව බහුවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කරයි.

සභාවේ ප්‍රධාන වගකීම් සහ කාර්යභාරයන් වන්නේ සේවා නියුක්තිය, පුහුණුව සහ අධ්‍යාපනය සම්බන්ධ හෝ ඒ හා අදාළ වන ආංශික මානව සම්පත් තාර්කිකකරණය සහ සම්බන්ධීකරණය; විද්‍යාව සහ තාක්ෂණය යොදාගැනීම; ජීවන තත්ත්වය ඉහළ නැංවීම; අවාසි සහගත පුද්ගල කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂණය සැලසුම් කිරීම; සහ ආර්ථික ප්‍රතිසංස්කරණ සමඟින් හිමිකම් පවත්වා ගැනීම ඇතුළත්ව සියලුම අංශවලින් ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීමයි.

2019 වර්ෂය සඳහා අපගේ මූලික පරමාර්ථය වූයේ "අපගේ ශ්‍රම බලකායේ අනාගතය සූදානම්" යන ආයතනික දැක්ම සාක්ෂාත් කර ගැනීමයි.

පොදු රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලය, පාසල් විදුහල්පතිවරුන්, විශ්ව විද්‍යාල පරිපාලන කාර්ය මණ්ඩලය සහ විශ්ව විද්‍යාල කාර්මික නිලධාරීන් වැනි විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා විදේශ පුහුණු වැඩසටහන් අටක් සංවිධානය කිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සමත් විය. මෙම වැඩසටහන් වල ප්‍රධාන පරමාර්ථය වූයේ රැකියා ආශ්‍රිත නිපුණතා සහ රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ඒක පුද්ගල ප්‍රවර්ධනය ඉහළ නැංවීමයි. පිලිපීනය, මැලේසියාව සහ සිංගප්පූරුව යන රටවල සහයෝගයෙන් මෙම වැඩසටහන් පැවැත්විණි.

එසේම, කළමනාකරණ මට්ටම්වල සහ එයට පහළ මට්ටම් වල සිටින රාජ්‍ය සේවකයින්ගේ කුසලතා නංවාලීම සඳහා එනම් රාජ්‍ය නිලධාරීන්ගේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම, රාජ්‍ය සේවකයාගේ කාර්යභාරය වෙනස් කිරීම, ආතතියෙන් තොර සේවකයින් බිහිකරලීම සම්බන්ධයෙන් දේශන මාලාවක් පවත්වන ලදී. මෙම වැඩසටහන් වල අරමුණ වූයේ සාරධර්මානුකූළ, ඵලදායී හා පුරවැසි කේන්ද්‍රීය කළමනාකරණ ශ්‍රම බලකායක් සමඟින් රාජ්‍ය සේවාවන් සැපයීමේ ගුණාත්මක බව ඉහළ නැංවීමයි.

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය අංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තීරණාත්මක කරුණකි. මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින ව්‍යවසායකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පළාත් සභා අමාත්‍යාංශයේ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සහයෝගයෙන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පාඨමාලා මොඩියුලයක් නිර්මාණය කළේය. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වන්නේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ තාක්ෂණික දැනුමට අදාළ

නිපුණතා කුසලතා හා එක්ව මනා කළමණාකරණ කුසලතා සමඟින් ව්‍යවසායකත්වය සපයා දීම පිණිස සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් සඳහා පහසුකම් සැලසීමයි.

පාසල් පද්ධතිය තුළ වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීමේ අරමුණින් අප සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය සමග වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු පවත්වන ලදී.

තීරණාත්මක වර්ධන කර්මාන්තවලට නව කුසලතා ග්‍රහණය කර ගැනීම සඳහා දක්ෂ හා නුපුහුණු තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් "රැකියා අරුණ" වැඩසටහන පවත්වන ලදී. සෑම වසරකම සිසුන්ගෙන් 47% ක් පමණ සාමාන්‍ය අධ්‍යාපනයෙන් සහ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පද්ධතියෙන් ඉවත් වේ. මෙසේ ඉවත් වන සිසුන් මැද පෙරදිග රටවල් සඳහා සංක්‍රමණය වීම, ත්‍රිරෝද රථ ධාවනය වැනි නුපුහුණු ශ්‍රම බලකායට පිවිසේ. මානව ප්‍රාග්ධන සමුළුව, කාර්මික සංසද, ප්‍රතිපත්ති සංවර්ධනය හා වෘත්තීය ප්‍රදර්ශන සහ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් වැනි විසඳුම් තුළින් ජාතික මානව සම්පත් සංවර්ධන සභාව වාර්ෂික ව්‍යාපෘති හරහා ක්‍රියාකාරකම් බොහොමයක් සිදු කරන ලදී.

තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ප්‍රජාව සවිබල ගැන්වීමේ අරමුණින් ධීවර ප්‍රජාව සඳහා වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

ජාතියේ අනාගත ආර්ථිකයේ සාර්ථකත්වය පිණිස අපගේ මානව සම්පත් නිපුණතා ගොඩනැගීම උදෙසා අප දරණ උත්සාහයට 2019 වාර්ෂික වාර්තාව සාක්ෂි සපයනු ඇතැයි මම විශ්වාස කරමි.

දිනේෂ් වීරක්කොඩි
සභාපති

පටුන

1.ආයතනික පසුබිම හා විෂය පථය .......... 1

2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය .......... 4

3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන .......... 6

4.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු .......... 7

5. 2019 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ අංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති .......... 11

5.1 ඵලදායී හා සදාචාරාත්මක රාජ්‍ය සේවා සංස්කෘතියක් සඳහා පොදු නිපුණතා රාමුව (CFW) .......... 11

5.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම .......... 13

5.3 රාජ්‍ය සේවකයින් සඳහා දේශන මාලාව - 2019 .......... 15

5.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යවසායකයින් බිහිකිරීම .......... 17

5.5 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංඛ්‍යාන අත්පොත .......... 18

6. 2019 දී පෞද්ගලික අංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති .......... 19

6.1 රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් - 2019 .......... 19

6.2 වෙරළබඩ ධීවර පවුල්, වාරකන් තුළ කාලය ඵලදායී ලෙස යොදා ගැනීම .......... 21

6.3 පාසල්වල වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන .......... 24

6.4 රැකියා අරුණ වෘත්තීය ප්‍රදර්ශනය සහ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන .......... 27

6.5. කාන්තාවන් සවිබල ගැන්වීම .......... 32

7. 2019 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සිදුකරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන .......... 33

8. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය .......... 34

9. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය .......... 36

10. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය .......... 37

11. මුදල් ප්‍රවාහ ප්‍රකාශය .......... 38

12. සටහන් .......... 40

13. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන් .......... 46

14.විගණන විමසුම් හා පිළිතුරු .......... 50

# 1.ආයතනික පසුබිම හා විෂය පථය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැදගත් කාර්ය භාරයක් ඉටුකිරීමට 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතින් ස්ථාපිත කරන ලද ආයතනයකි. එම ආයතනයට ලබාදී ඇති බලතල යටතේ මානව සම්පත් සංවර්ධනයෙහිලා සියලු කටයුතුවලදී ප්‍රමුඛතාවය දීමටත් මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කිරීමටත් ප්‍රවර්ධනය කිරීමටත් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමටත් යනාදී වැදගත් කාර්යභාරයනට වගකීම දරයි. එහි ප්‍රධාන පරමාර්ථය වන්නේ මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හා උපදෙස් අදාළ අමාත්‍යවරයාට සහ රජයට ලබා දීමයි.

## 1.1ආයතනික හැඳින්වීම

ජාතික මට්ටමේ උපදේශක මණ්ඩලයක් වශයෙන් 1987 ජුනි මස 05 වන දින මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව ආරම්භ වූයේ යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙනි. ඉන් ඉක්බිතිව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනත මඟින් ස්වාධීන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. එතැන් සිට කෙටි කාලයක් තුළදී, එනම් 2000 වර්ෂයේදී මෙම ආයතනය කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතට පැවරෙන අතර, 2001 දී එය අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතටද ඉන්පසු නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශයේද, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ පාලනයටද නතු විය. මෙසේ කෙටි කාලයක් තුළ අමාත්‍යාංශ රැසකට අනුබද්ධවී කටයුතු කළ මෙම ආයතනය, වර්තමානයේදී ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ සිය කටයුතු පවත්වා ගෙන යයි.

### 1.2 දර්ශනය

''අනාගතය සඳහා සූදානම් ශ්‍රම බලකායක්''

### 1.3 මෙහෙවර

රටෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා ඵලදායි ප්‍රතිපත්ති හා නව්‍යකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම

## 1.4 අරමුණ

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අරමුණ වනුයේ රජයට මානව සම්පත් සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශකත්වය ලබා දීමට සුදුසු ආයතනික රාමුවක් බිහිකිරීමයි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාවලි සැලසුම, ප්‍රතිපත්ති සමාලෝචනය හා මානව සම්පත් සංවර්ධනය කිරීමත් යනාදී අංශ සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව වගකීම් දරයි.

සභා පනතේ 14(1) වගන්තියට අනුව සභාවේ කාර්ය සහ කර්තව්‍ය පහත පරිදි වේ. පහත දැක්වෙන කාරණාවලට එනම් -

i. (අ) රැකී රක්ෂා, පුහුණුව හා අධ්‍යාපනය

(ආ) විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ඇ) ජීවන තත්වය නංවාලීම

(ඈ) අවාසිකර තැනැත්තන්ගේ කණ්ඩායම් සඳහා සමාජ ආරක්ෂාව සැලසුම් කිරීම සහ

(ඉ) ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් හිමිකම් රැකදීම සම්බන්ධයෙන් වන හෝ අදාළ වන මානව සම්පත් බණ්ඩ පරිමේය කිරීම සහ සමෝධානය කිරීම ඇතුළුව, ජාතික මානව සම්පත් ප්‍රතිපත්තියේ සියලු අංශවලින් අමාත්‍යවරයාට උපදෙස් දීම

ii. ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ මානව සම්පත් සංවර්ධනය කිරීමේ සැලසුම් හා වැඩසටහන් රජයට ඉදිරිපත් කිරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

iii. ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මකව පවත්නා සැලසුම් සහ වැඩසටහන් කලින් කල සමාලෝචනය කිරීම හා පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වන විටක, ඒ ප්‍රතිපත්තියට, සැලසුම්වලට හා වැඩසටහන්වලට කළයුතු වෙනස් කිරීම් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම.

iv. ආණ්ඩුව විසින් අනුමත කරන ලද මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීම

v. මේ පනතේ උපලේඛනයේ සඳහන් කවර හෝ විෂයයන් හා සම්බන්ධ යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. එසේ වුවද එම ව්‍යාපෘතිය වෙනත් යම් අමාත්‍යවරයෙකුට පවරා තිබෙන විෂයයන් හා සම්බන්ධ වන අවස්ථාවක, එය ක්‍රියාත්මක කිරීම, ඒ වෙනත් අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව විය යුතුය සහ

vi. ජාතික අරමුණුවලට අනුකූලව මානව සම්පත් සංවර්ධනය කිරීමට අවශ්‍ය යයි හෝ හිතකර යයි හෝ ආනුෂංගික යයි සභාව අදහස් කරන වෙනත් සියලු ක්‍රියා සිදුකිරීම

## 1.5 සභාව සතු බලතල

1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ 16 (2) (1) වන උප වගන්තිය අනුව සභාව සතු බලතල මෙසේය.

අ) සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන සහ පර්යේෂණ කිරීමට.

(ආ) මානව සම්පත් සංවර්ධනයට අදාළව කාරණා සම්බන්ධයෙන් විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනයාගේ මතය දැන ගැනීම සඳහා ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව කරුණු විමසීමට.

(ඇ) සභාව විසින් ඉටුකරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි ජාත්‍යන්තර නියෝජ්‍යායතන සහ වෙනත් සංවිධාන සමඟ සම්බන්ධතා ඇතිකර පවත්වාගෙන යාමට.

(ඈ) මේ පනත යටතේ සභාවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත්තුවලට සහ ගිවිසුම්වලට එළඹීමට සහ ඒවා ඉටු කිරීමට.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල පිහිටි ආයතන හෝ පුද්ගලයින් මගින් මානව සම්පත් සංවර්ධන පර්යේෂණ පැවැත්වීම සඳහා කටයුතුවල යෙදීමට.

(ඊ) මානව සම්පත් සංවර්ධනය හා ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට.

(උ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට.

(ඌ) චංචල සහ නිශ්චල යන දෙවර්ගයේම ආධාර හා පරිත්‍යාග පිළිගැනීමට සහ භාරගැනීමට.

(එ) මානව සම්පත් සංවර්ධනයේ විවිධ අංශවල නිපුණ විශේෂඥ සංචිතයක් සංවර්ධනය අරමුණු කර ගෙන සභාවේ නිළධරයන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට.

(ඒ) සභාවේ කර්තව්‍ය සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කමිටු, විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීමට.

(ඔ) අමාත්‍යාංශවලින්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින්, රාජ්‍ය සංස්ථාවලින්, ව්‍යවස්ථාපිත මණ්ඩලවලින්, පළාත් සභාවලින්, පළාත් පාලන ආයතනවලින් සහ පෞද්ගලික අංශයේ ආයතනවලින් ලබා ගන්නා සංඛ්‍යා ලේඛන ඇතුළුව සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන තොරතුරු ඉල්ලා සිටීමට සහ ඒවා ලබා ගැනීමට. සහ

(ඕ) සභාවේ කර්තව්‍ය බලතල සහ කාර්ය ඉටු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය යැයි හිතකර යැයි හෝ ආනුෂංගිකයයි සභාවේ මතය අනුව සභාව විසින් සලකනු ලබන සියලු පියවර ගැනීමට.

## 2. මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන ව්‍යුහය

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන මෙම සභාව 1997 අංක 18 දරණ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභා පනතේ විධිවිධාන යටතේ පත්කළ සභාපති සහ සාමාජිකයින් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් 15 දෙනෙකු නිල බලයෙන් පත්වන අතර අදාළ ආයතනවලින් 5 දෙනෙකු සාමාජිකයන් ලෙස පත්වනු ඇත. ඒ හැරුණු විට අදාළ ක්ෂේත්‍රයන්හි පළපුරුද්ද හැකියාව යනාදිය සලකා 5 දෙනෙකු පත්කරනු ලබන අතර මින් දෙදෙනෙකු පුද්ගලික අංශයෙන් වේ. සභා සභිකයන් අතුරින් එක් අයෙකු විධායක සභාපති සේ නම් කිරීමට විෂයභාර ඇමතිතුමාට බලය පැවරේ. මෙහි ප්‍රධාන විධායක නිළධාරියා වනුයේ සභාවේ සභාපතිය. 2019.12.31 දින වනවිට සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත විය. 2019.12.31 දිනට සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

**පනතේ 3(1) (අ) සිට (ච) දක්වා වගන්ති යටතේ කර ඇති පත්වීම්**

1. සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව
2. ලේකම්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයභාර අමාත්‍යාංශය
3. ලේකම්, උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය
4. ලේකම්, අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය
5. ලේකම්, විද්‍යා හා තාක්ෂණ විෂයභාර අමාත්‍යාංශය
6. ලේකම්, කම්කරු විෂයභාර අමාත්‍යාංශය
7. ලේකම්, රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය
8. ලේකම්, සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය
9. ලේකම්, කර්මාන්ත සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය
10. ලේකම්, කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශය
11. සභාපති, තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
12. අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
13. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
14. සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
15. සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
16. ලේකම්, මුදල් විෂයභාර අමාත්‍යාංශය


**පනතේ 3 (2) (ග) වගන්තිය යටතේ පත්කිරීම්**

1. මහාචාර්ය කාමෙනා ගුණරත්න මයා, පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, විවෘත විශ්ව විද්‍යාලය
2. මහාචාර්ය රංගික හල්වතුර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්ව විද්‍යාලය
3. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙනිය මයා, 165/1සී, පොල්හේන්ගොඩ පාර, කොළඹ-05
4. උපාලි රත්නායක මයා, 2000 ප්ලාසා නිවාස, 25, නව රෝහල් පාර, ශ්‍රී ජයවර්ධනපුර, නුගේගොඩ

2019 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පාලක මණ්ඩල රැස්වීම් පැවැත් වූ දිනයන් හා සහභාගී වූ සාමාජිකයන් පිළිබඳ විස්තර -

| # | පාලක මණ්ඩල සාමාජිකයා සහ ආයතනය | 2019.06.21 | 2019.07.29 | 2019.09.19 | 2019.10.29 |
|---|---|---|---|---|---|
| 01. | **සභාපති, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව** | √ | √ | √ | √ |
| 02. | **ලේකම්, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂය භාර අමාත්‍යාංශය** | *√ | *√ | - | - |
| 03. | **ලේකම්, උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය** | - | √ | - | - |
| 04. | **ලේකම්, අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය** | √ | √ | - | - |
| 05. | **ලේකම්, විද්‍යා, තාක්ෂණ විෂය භාර අමාත්‍යාංශය** | - | - | √ | √ |
| 06. | **ලේකම්,කම්කරු විෂය භාර අමාත්‍යාංශය** | - | √ | √ | √ |
| 07. | **ලේකම්,රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය** | - | - | - | - |
| 08. | **ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය** | √ | √ | √ | - |
| 09. | **ලේකම්, කාර්මික සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය** | - | - | - | √ |
| 10. | **ලේකම්,කෘෂිකාර්මික විෂය භාර අමාත්‍යාංශය** | √ | √ | - | - |
| 11. | **සභාපති,තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව** | √ | √ | √ | √ |
| 12. | **අධ්‍යක්ෂ ජෙනරාල්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව** | √ | √ | √ | √ |
| 13. | **සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව** | √ | √ | √ | - |
| 14. | **සභාපති, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** | - | √ | - | - |
| 15. | **සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය** | √ | - | - | - |
| 16. | **නියෝජිත, මුදල් විෂය භාර අමාත්‍යාංශය** | √ | - | √ | √ |
| 17. | **මහාචාර්ය කාමෙනා ගුණරත්න මිය(පත්කල සාමාජික)** | - | - | - | √ |
| 18. | **ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා(පත්කල සාමාජික)** | √ | √ | √ | √ |
| 19. | **ආචාර්ය රංගික හල්වතුර මහතා (පත්කල සාමාජික)** | √ | √ | - | √ |
| 20. | **උපාලි රත්නායක මහතා (පත්කල සාමාජික)** | √ | √ | √ | √ |
| | **සහභාගි වූ මුළු සංඛ්‍යාව** | **13** | **14** | **10** | **11** |

## 3.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සංවිධාන සටහන



**4.**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සේවක ලැයිස්තුව හා ඔවුන්ගේ තනතුරු:

| තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | **2019.12.31** දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව | **2019.12.31** දිනට පුරප්පාඩු සංඛ්‍යාව | නම |
|---|---|---|---|---|
| සභාපති | 01 | 01 | - | දිනේෂ් වීරක්කොඩි මහතා |
| අධ්‍යක්ෂ | 01 | 01 | - | කේ.ඒ ලලිතධීර මහතා |
| සහකාර අධ්‍යක්ෂ | 03 | 03 | - | ජේ.ඒ.සී.පී. ජයසිංහ මිය<br>එස්. තනිගසීලන් මහතා<br>එස්.එස්. කළුආරච්චි මිය |
| සභා ලේකම්/නීති නිලධාරි | 01 | 01 | - | ජී.ජී. කසුනි උත්පලා මෙනවිය |
| පර්යේෂණ නිලධාරි | 04 | 04 | - | ඩී.සෙන්තිල්නාදන් මහතා<br>එන්.ඩී එදිරිසිංහ මෙනවිය<br>ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා<br>යූ.එම්. වීරසේන මෙනවිය |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - | කේ.වී.එස්. එරංගා මිය |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | - |
| සංවර්ධන නිලධාරි | 04 | 01 | 03 | කේ.පී.පී. පෙරේරා මහතා |
| සභාපතිගේ පෞද්ගලික සහකාර | 01 | - | 01 | - |
| කළමනාකරණ සහකාර | 08 | 06 | 02 | සී.ආර්. මද්දගේ මහතා<br>එම්.ජී.එන්. දිල්හාරි මිය<br>කේ.සී මුතුමාල මෙනවිය<br>ජී.එම් සද්ධාමංගල මිය<br>ආශා සුරේනි එදිරිසිංහ මිය<br>හිරුණි වමෝදි මෙනවිය |
| රියැදුරු | 04 | 04 | - | ජී.එම්. පින්නදූව මහතා<br>ටෙරන්ස් පියල් මහතා<br>ආර්.සී.ආර්. ජයවර්ධන මහතා<br>ගයාන් ජීවන්ත මහතා |
| කාර්යාල සහායක | 04 | 03 | 01 | එන්.ජී. නදුන් මධුරංග මහතා<br>ඩබ්.ආර්.ඒ. ප්‍රින්ස් ග්‍රැන්විල් මහතා<br>ඒ. නයනා ප්‍රියදර්ශනී මෙනවිය |
| **මුළු එකතුව** | **33** | **25** | **08** | |

**නව බඳවා ගැනීම්**

| නම | තනතුර | බඳවාගත් දිනය |
|---|---|---|
| 1) එස්.එස්. කළුආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) | 2019/02/11 |
| 2) යූ.එම්. වීරසේන මෙනවිය | පර්යේෂණ නිලධාරි | 2019/02/11 |
| 3) ආර්.ඩී.සී.එස්. රාජපක්ෂ මහතා | පර්යේෂණ නිලධාරි | 2019/02/11 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| 1) කේ.එල්.එස්.එන් කඹුරුගමුව මිය | කළමනාකරණ සහකාර | 2019/08/07 |
| 2) කේ.සී ගුරුසිංහ මිය | සංවර්ධන නිලධාරි | 2019/08/11 |

**දේශිය හා විදේශීය පුහුණුව**

සමාලෝචිත වසර තුළ, ආයතනයේ කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වැඩි කිරීමේ අරමුණ ඇතිව, ඔවුන් වෙත දේශීය සහ විදේශීය පුහුණු ලබාදෙන ලදි. වර්ෂයේ පුහුණු වූ නිලධාරීන්ගේ විස්තර පහත දැක්වේ.

| # | නිලධාරියාගේ නම | තනතුර | පුහුණු වැඩසටහන / සම්මන්ත්‍රණය / සංසදය | ආයතනය |
|---|---|---|---|---|
| | කේ.සී.ගුරුසිංහ | සංවර්ධන නිලධාරි | ඉංග්‍රීසි ඩිප්ලෝමාව | කැළණි විශ්ව විද්‍යාලය |
| | කේ.ඒ.ලලිතධීර<br>කේ.වී.එස්.එරංගා | අධ්‍යක්ෂ<br>පරිපාලන නිලධාරි | පුහුණු අවශ්‍යතා විශ්ලේෂනය | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | කේ.වී.එස් .එරංගා<br>ජී.පී.එම්. සද්ධාමංගල | පරිපාලන නිලධාරි<br>කළමනාකරණ සහකාර | විනය ක්‍රියා පටිපාටි | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | සුජීවා කලුආරච්චි | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | රාජ්‍ය සේවයේ ගණකාධිවරුන් සඳහා වූ වැඩමුළුව | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය |
| | සුජීවා කලුආරච්චි | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | අයවැය සංසදය | එම්බීඒ -ඇලුම්නි සංගමය කොළඹ වි.විද්‍යාලය |
| | නයනා ප්‍රියදර්ශනී | කාර්යාල සහායක | දූරකථන ආචාර විධි සහ පාරිභෝගික සත්කාරය | හෙඩ් මාස්ටර් ආයතනය |
| | ප්‍රින්ස් ගුන්විල් | කාර්යාල සහායක | ඔබේ ආයතනයට අභිමානයක් වන්න | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | මධුරංග පින්නදූව | රියදුරු | ආචාර ධර්ම හා විනය | ශ්‍රී ලංකා නිපුණතා සංවර්ධන අරමුදල |
| | හිරුණි වමෝදි | කළමනාකරණ සහකාර | ඉංග්‍රීසි පාඨමාලාව | බ්‍රිතාන්‍ය කවුන්සිලය |
| | ජී.ජී. කසුනි උත්පලා | නීති නිලධාරි | සමාගම් ලේකම්වරයෙකුගේ කාර්යභාරය | ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය |
| | ප්‍රභාත් පෙරේරා<br>එම්.සද්ධාමංගල | සංවර්ධන නිලධාරි<br>කළමනාකරණ සහකාර | අභ්‍යන්තර විගණනය | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| | ශෂිනිකා නවංජිනී | කළමනාකරණ සහකාර | ප්‍රතිඵල සහිත ලේඛනය | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | කසුනි උත්පලා | නීති නිලධාරි | මණ්ඩල නායකත්වය | SLID |
| | නවෝදා<br>සංදීප රාජපක්ෂ<br>උදා වීරසේන | පර්යේෂණ නිලධාරි<br>පර්යේෂණ නිලධාරි<br>පර්යේෂණ නිලධාරි | පර්යේෂණ සම්මන්ත්‍රණය | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | කේ.ඒ.ලලිතධීර<br>එස්.ටී.සීලන් | අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ | ඉහළ කාර්ය සාධන නායකත්වය | ශ්‍රී ලංකා මෘදුකාංග හා සේවා සමාගම් සංගමය |
| | කේ.ඒ.ලලිතධීර | අධ්‍යක්ෂ | සේවාමුර මෙහෙයවීමේ කලාව | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | කසුනි උත්පලා | නීති නිලධාරි | මූල්‍ය භාරකාරත්වය සහ වගවීම | SLID |
| | මධුභාෂිනී සද්ධාමංගල | කළමනාකරණ සහකාර | ජාතික මානව සම්පත් සම්මේලනය | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | උදා වීරසේන<br>හිරුණි වමෝදි | පර්යේෂණ නිලධාරි<br>කළමනාකරණ සහකාර | තිරසාර ජාතික සංවර්ධනය | ශ්‍රී ලංකාවේ වෘත්තීය සංගම් සංවිධානය |
| | තනිගසීලන්<br>සංදීප රාජපක්ෂ | සහකාර අධ්‍යක්ෂ<br>පර්යේෂණ නිලධාරි | පර්යේෂණ ක්‍රම පිළිබඳ වැඩමුළුව | උපායමාර්ගික අධ්‍යයන සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය |
| | කේ.ඒ.ලලිතධීර<br>නවෝදා එදිරිසිංහ<br>සංදීප රාජපක්ෂ<br>උදා වීරසේන | අධ්‍යක්ෂ<br>පර්යේෂණ නිලධාරින් | කළමනාකරණ සම්මේලනය | වරලත් පිරිස් කළමනාකර ආයතනය |
| | එස්. තනිගසීලන් | සහකාර අධ්‍යක්ෂ | කඳවුරු ආරම්භය | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | ජේ.ඒ.සී.පී.ජයසිංහ | සහකාර අධ්‍යක්ෂ | චිත්තවේගාත්මක බුද්ධිය | වරලත් පිරිස් කළමනාකරණ ආයතනය |
| | කසුනි උත්පලා | නීති නිලධාරි | අධ්‍යක්ෂකගේ සහ මණ්ඩලයේ කාර්යභාරය | SLID |

**දේශීය පුහුණු - පුද්ගල**

| පුහුණු වැඩසටහන | සම්පත් දායකයා/ආයතනය | කාල සීමාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| ප්‍රසම්පාදනය | අනුර ලොකුගමගේ මහතා | දින 1 | සියලුම කාර්ය මණ්ඩලය |
| ආතතියෙන් තොර සේවා නියුක්තියක් | ප්‍රභාත් කරුණානායක මහතා | දින ½ | සියලුම කාර්ය මණ්ඩලය |
| සංයුක්ත සැලැස්ම සකස් කිරීම | ආචාර්ය සමන්ත රත්නායක මහතා | දින 1 | සියලුම කාර්ය මණ්ඩලය |

**විදේශීය පුහුණු - පුද්ගල**

| අංකය | නම | තනතුර | පුහුණු වැඩ සටහනේ නම | ආයතනය |
|---|---|---|---|---|
| 1 | නවෝදා එදිරිසිංහ | පර්යේෂණ නිලධාරි | IIHS-OUM අධ්‍යාපන නායක පරපුර නිර්මාණය කිරීම | විවෘත විශ්ව විද්‍යාලය - මැලේසියාව |
| 2 | ප්‍රභාත් පෙරේරා | සංවර්ධන නිලධාරි | කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන | පුත්‍රා විශ්ව විද්‍යාල- මැලේසියාව |
| 3 | කේ.ඒ.ලලිතධීර | අධ්‍යක්ෂ | අනාවරණ චාරිකාව- වෘත්තීය මාර්ගෝපදේශනය | බ්‍රිතාන්‍ය කවුන්සිලය- එක්සත් ජනපදය |

# 5. 2019 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ අංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති

## 5.1 ඵලදායී හා සදාචාරාත්මක රාජ්‍ය සේවා සංස්කෘතියක් සඳහා පොදු නිපුණතා රාමුව (CFW)

අඛණ්ඩව වෙනස් වන පරිසරයක, දක්ෂ හා පළපුරුදු කළමනාකරුවන් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව පිළිබඳ සලකා බැලීමේ දී, සේවා සැපයීම පෞද්ගලික අංශයට වඩා රාජ්‍ය අංශය මත රඳා පවතින අතර එය මහජනයාට අත්‍යවශ්‍ය හා සංවේදී සේවාවන් බොහොමයක් සපයයි. ඒ අනුව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ කුසලතා හා නිපුණතා ඉහළ නැංවීම සඳහා අධ්‍යයනයක් සිදු කළේ ය. ප්‍රවීණ විද්වත් මණ්ඩලයක් සමඟ එක්ව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් සිදු කරන ලද අධ්‍යයනය මත පදනම්ව, රාජ්‍ය අංශය සඳහා පොදු නිපුණතා රාමුවක් (CFW) සකස් කරන ලද අතර එය 2017 ජුනි 27 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මෙම පොදු නිපුණතා රාමුවෙහි පුරවැසි අවධානය, නවෝත්පාදන හා විපරමාණ කාරකය, ඵලදායී සන්නිවේදනය, කණ්ඩායම් කටයුතු, නායකත්වය සහ උපායමාර්ගික සහ පද්ධති චින්තනය යන ප්‍රධාන නිපුණතා හතක් හඳුනාගෙන ඇත.

**පොදු නිපුණතා රාමුව ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල -**

- සදාචාරාත්මක, ඵලදායී හා පුරවැසි කේන්ද්‍රීය/කේන්ද්‍රීය කළමනාකරණ ශ්‍රම බලකායක් සමඟ රාජ්‍ය සේවාවන් සැපයීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- රාජ්‍ය සේවකයින්ගේ සේවාවේ ගුණාත්මකභාවය සහ ඔවුන්ගේ සන්තෘප්තිය, පක්ෂපාතිත්වය සහ කැපවීම පිළිබඳ හැඟීම වැඩි දියුණු කිරීම
- රාජ්‍ය අංශය සඳහා නිවැරදි පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම, තෝරා ගැනීම සහ ඔවුන් රඳවා ගැනීම සඳහා පොදු නිපුණතා රාමුවක් සකස් කිරීම
- රාජ්‍ය අංශයේ නව සංස්කෘතියක් ඇති කිරීම

අනාගතයේ දී රාජ්‍ය අංශයේ පුහුණු ආයතනයේ සහයෝගයෙන් මෙම රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව අපේක්ෂා කරයි. මෙම නිපුණතා රාමුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් සියළුම ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා භාවිතා කරනු ලැබේ. නියමු ව්‍යාපෘතියක් ලෙස එය රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී. වැඩසටහන් වල සාරාංශය පහත දැක්වේ. රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සහභාගී වූ අතර ඔවුන්ගෙන් 80% ක ගේ ප්‍රතිචාරය වූයේ එම දේශන වඩාත් ඵලදායී බවයි.

| මාතෘකාව | සම්පත් දායකයාගේ නම | දිනය සහ ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව | සංවිධානය කිරීම |
|---|---|---|---|---|
| පුරවැසි අවධානය (Citizen Focus) | මහාචාර්ය ගාමිනි ද අල්විස්, කළමනාකරණ උපදේශක, පුහුණුකරු | 2019 07.22 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනය (HARTI ) | 80 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| පුරවැසි අවධානය | මහාචාර්ය ගාමිනි ද අල්විස්, කළමනාකරණ උපදේශක, පුහුණුකරු | 2019.11.28 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මඩකලපුව | 150 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මඩකලපුව |
| නවෝත්පාදන සහ විපරිමාණ කාරකය(Innovation and Change Agent) | එච්.බී.හේරත් මයා, ටී.එම්.ජයසේකර මයා, ඉසාමිල් ඒ. අසීස් මයා, කළමනාකරණ උපදේශක, ජාත්‍යන්තර සංවර්ධන පුහුණු ආයතනය | 2019.12.12 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනය | 70 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |

**වැඩසටහනෙහි ඡායාරූප කිහිපයක් :**

**පුරවැසි අවධානය *- HARTI***





**පුරවැසි අවධානය – දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව**





**නවෝත්පාදන සහ විපරිමාණ කාරකය - *HARTI***





## 5.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. ඒ අනුව, ලියාපදිංචි හා ක්‍රියාකාරී මට්ටමේ කාන්තා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් "ජාත්‍යන්තර කාන්තා දිනයට" සමගාමීව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 මාර්තු 7 වන දින පෙ.ව. 9.30 සිට ප.ව 2.30 දක්වා අනුරාධපුර සල්ගාදු ක්‍රීඩාංගණයේ දී සාර්ථකව පවත්වන ලදී.

මෙම වැඩසටහන අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ සහ කාන්තා හා ළමා වියළි කලාපීය සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගයෙන් සංවිධානය කරන ලදී. කාන්තා හා ළමා හා වියළි කලාපීය සංවර්ධන ඇමතිනී ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිණිය ද මෙම අවස්ථාවට සහභාගී විය.

මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම වන අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 182 ක් ඒ සඳහා සහභාගි විය. පහත මාතෘකා යටතේ දේශන පවත්වන ලදී.

| | මාතෘකාව | සම්පත් දායකත්වය | සහභාගී වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අපනයන සංවර්ධන මණ්ඩලයෙහි කාර්යභාරය හා ක්‍රියාකාරිත්වය, අපනයන වෙළඳපොළ අවස්ථා සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටළු | සහකාර අධ්‍යක්ෂ, අපනයන සංවර්ධන මණ්ඩලය | 182 |
| 2 | මූල්‍ය සාක්ෂරතාවය, මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය පහසුකම් | ශ්‍රී ලංකා මහ බැංකුව, අනුරාධපුර ශාඛාව | |
| 3 | අලෙවිකරණ නව ක්‍රම (ඊ-අලෙවිකරණය) | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | |

**වැඩසටහනෙහි ඡායාරූප කිහිපයක් :**









## 5.3 රාජ්‍ය සේවකයින් සඳහා දේශන මාලාව - 2019

ගුණාත්මක රාජ්‍ය සේවාවක් ඇති කිරීම සඳහා රාජ්‍ය අංශයේ සේවකයින්ගේ ගුණාත්මකභාවය හා ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් මේ වසරේ විශේෂ දේශන මාලාවක් පවත්වන ලදී. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ කුසලතා ඉහළ නැංවීමේ දේශන මාලාව විවිධ මට්ටම්වල රාජ්‍ය නිලධාරීන් සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සභාපතිතුමාගේ සංකල්පයකට අනුව 2016 සිට ආරම්භ කරන ලදී.

අප සභාවේ පරමාර්ථය වන්නේ විවිධ අංශ නියෝජනය කරන දක්ෂ කථිකාචාර්ය මඩුල්ලක් හරහා ගුණාත්මක රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම උදෙසා රාජ්‍ය අංශයේ සේවකයින්ගේ ගුණාත්මකභාවය හා ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණ සහිතව කොළඹ මෙන්ම පිට පළාත්වල පිහිටා ඇති රාජ්‍ය අංශය සඳහා ඵලදායී දේශන මාලාවක් පවත්වා ගෙන යාමයි.

2019 වර්ෂය තුළ පවත්වන ලද දේශනවල සාරාංශය පහත දැක්වේ.

| දේශනයේ නම | සම්පත් දායකයාගේ නම | දිනය සහ ස්ථානය | සහභාගිවූ සංඛ්‍යාව | සංවිධානය කිරීම |
|---|---|---|---|---|
| රාජ්‍ය නිලධාරීන්ගේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම | කිෂු ගෝමස් මහතා | 14.05.2019<br>ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 100 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| රාජ්‍ය සේවකයාගේ භූමිකාව වෙනස් කිරීම | ධම්මික පෙරේරා මහතා | 24.09.2019<br>ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) | 200 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව සහ වැලිබල් පීඑල්සී ආයතනය |
| ආතතියෙන් තොර සේවා නියුක්තියක් | ආචාර්ය ප්‍රභාත් කරුණාරත්න මයා | 06.11.2019<br>හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනය (HARTI) | 100 | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |

**වැඩසටහන් වල ඡායාරූප කිහිපයක් :**






රාජ්‍ය නිලධාරීන්ගේ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම, SLITHM






ආතතියෙන් තොර සේවා නියුක්තියක්, HARTI






රාජ්‍ය සේවකයාගේ කාර්යභාරය වෙනස් කිරීම, **SLITHM**

## 5.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යවසායකයින් බිහිකිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය අංශයේ පවතින අර්බුදකාරී ගැටළුවකි. මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින ව්‍යවසායකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පළාත් සභා අමාත්‍යාංශයේ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ සහයෝගයෙන් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව පාඨමාලා මොඩියුලයක් නිර්මාණය කළේ ය. මෙම පාඨමාලාව තුළින් අපද්‍රව්‍ය ගැටලුවට දිගුකාලීන විසඳුමක් සෙවීම සහ මෙම ක්ෂේත්‍රයේ නව වෘත්තීය මාර්ග ව්‍යවසායකයින් බවට පත් කිරීම අපේක්ෂා කෙරේ. මෙම පාඨමාලාවේ නියමු වැඩසටහනක් ලෙස අප සභාව 2019 ඔක්තෝබර් 20 වන දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යවසායකත්ව අංශයේදී දියත් කරන ලදී. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වනුයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ තාක්‍ෂණික දැනුම පිළිබඳ නිපුණතා කුසලතා සමඟින් මනා කළමනාකරණ කුසලතා සහිත ව්‍යවසායකයින් බිහි කිරීම උදෙසා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පාඨමාලාවක් සඳහා පහසුකම් සැපයීමයි.

**වැඩසටහනෙහි අරමුණු:**

- ❖ ව්‍යවසායකත්ව මූලපිරීම් සංවර්ධනය කිරීම සඳහා මානසිකත්වය වෙනස් කිරීම
- ❖ පවත්නා අවිධිමත් ව්‍යාපාරික ව්‍යවසායකයින් තුළ විධිමත් ව්‍යාපාරික හැකියාවන් වර්ධනය කිරීම
- ❖ විශ්ව විද්‍යාල සහ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව හරහා NVQ 5 වන මට්ටමෙහි ඝන අපද්‍රව්‍ය ව්‍යවසායක සංවර්ධන වැඩසටහනක් හඳුන්වා දීම
- ❖ "පවිත්‍ර රටක්, හරිත පරිසරයක්" යන සංකල්ප ප්‍රවර්ධනය කිරීම පිණිස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා පාලනය කිරීම උදෙසා නව උපාය මාර්ග හඳුන්වා දීම

පළාත් සභා අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත් සභා ආවරණය කරමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පාඨමාලාව සඳහා පුහුණුකරුවන් තෝරා ගන්නා ලදී. න්‍යායාත්මක හා ප්‍රායෝගික සැසි සාර්ථකව නිම කිරීමට හැකිවන සෑම සහභාගිවන්නෙකුටම වටිනා සහතිකයක් ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ නියැලී සිටින ව්‍යවසායකයින්ට මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වනු ඇති අතර ව්‍යවසායකත්වය, කළමනාකරණය සහ තාක්‍ෂණික දැනුම පිළිබඳ ගවේෂණය කරමින් සහභාගිවන්නන් 22ක් දැනට මෙම පාඨමාලාව හදාරමින් සිටින අතර මෙම පුහුණුව මඟින් ඔවුන්ට සිය ව්‍යාපාරය තවදුරටත් දියුණු කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. මෙම පාඨමාලාවේ ප්‍රමිතිය නංවාලීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් ජාතික වෘත්තීය සුදුසුකම් පස්වන මට්ටම ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

**පාඨමාලාවට සහභාගිවන්නන් ඇතුළු සමූහ ඡායාරූපය :**



## 5.5 මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි සංඛ්‍යාන අත්පොත

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ දැක්ම අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය සම්බන්ධයෙන් අදාළ පාර්ශවකරුවන්ගේ තොරතුරු පරතරය සපුරාලීම පිණිස වාර්ෂිකව සංඛ්‍යාන අත්පොතක් පළ කිරීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ කළමනාකාරිත්වය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් 2015 වර්ෂයේ සිට ප්‍රකාශන 4 ක් පළ කර ඇති අතර නවතම ප්‍රකාශය 2019 වර්ෂයේ දී පළකර ඇත.

මෙම තොරතුරු ප්‍රකාශන තුළ සාමාන්‍ය අධ්‍යාපනය, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අංශවලට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන දත්ත ඇතුළත් වේ. වෙබ් අඩවියේ ඇති ද්විතීයික දත්ත මූලාශ්‍ර, ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංඛ්‍යාලේඛන ආදිය මත පදනම්ව සියලු දත්ත එක්රැස් කරන ලදී. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය කෙරෙහි උනන්දුවක් දක්වන පර්යේෂකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට මෙම ප්‍රකාශනයේ දත්ත වැදගත් වනු ඇත.

# 6. 2019 දී පෞද්ගලික අංශය විසින් සිදු කරන ලද ව්‍යාපෘති

## 6.1 රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් - 2019

"අපගේ ශ්‍රම බලකායේ අනාගතය සුදානම්" යන දැක්ම යටතේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා 2019 දී වඩාත් සාර්ථක වැඩසටහන් සංවිධානය කිරීමට අඛණ්ඩව කටයුතු කර ඇති අතර, මේ වසරේ දී පිලිපීනයේ පළමු පුහුණු වැඩසටහන් දියත් කිරීමට සභාව සමත් විය. මෙම වැඩසටහන් වල ප්‍රධාන පරමාර්ථය වනුයේ රැකියා ආශ්‍රිත නිපුණතා සහ රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ඒක පුද්ගල වර්ධනය ඉහළ නැංවීමයි.

2019 දී පොදු රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලය, උසස් කළමනාකරණ මට්ටමේ රාජ්‍ය අංශයේ නිලධාරීන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන් වැනි විවිධ ඉලක්කගත කණ්ඩායම් වෙනුවෙන් පුහුණු වැඩසටහන් තුනක් සංවිධානය කිරීමට හැකි විය. වැඩසටහන් තුන පහත පරිදි වේ.

### 6.1.1. කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන (MCDP)

මෙම වැඩසටහන මධ්‍යම හා උසස් රාජ්‍ය අංශයේ කළමනාකරණ කාර්ය මණ්ඩලය ඉලක්ක කරගත්තකි. සෑම වැඩසටහනක් සඳහාම දින තුනක දේශීය සැසියක් සමඟ මෙම වැඩසටහන පවත්වන ලදී. දේශීය සැසි සඳහා සම්පත් දායකයින් වූයේ රනිල් සුගතදාස මහතා, ආචාර්ය කසුන් නන්දපාල මහතා සහ චමීර උඩවත්ත මහතා ය. වැඩසටහන් තුනේ විස්තර පහත දැක්වේ.

**කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන III**

සහභාගිවූ සංඛ්‍යාව – 27

දේශීය සැසිය - පෙබරවාරි 27 සිට මාර්තු 1 දක්වාද, විදේශ සැසිය - 2019 මාර්තු 10 සිට මාර්තු 16 දක්වා

පැවැත්වූ රටවල්: මැලේසියාව සහ සිංගප්පූරුව.





### 6.1.2. ලංකා විදුලිබල මණ්ඩලය සඳහා විදේශ පුහුණුව

ව්‍යාපෘතියේ පරමාර්ථය: ලංකා විදුලිබල මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් සහ නඩත්තුව වැඩි දියුණු කිරීම

- ❖ සහභාගිවූ සංඛ්‍යාව : දහ දෙනෙක්
- ❖ කාල පරිච්ඡේදය : 2019 ජනවාරි 30 දින සිට පෙබරවාරි 5 දක්වා
- ❖ ඉලක්කගත කණ්ඩායම : ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරුවන්
- ❖ පැවැත්වූ රට : මැලේසියාව






### 6.1.3. නායකත්ව හා කළමනාකරණ සංවර්ධන වැඩසටහන

- ❖ ඉලක්ක කණ්ඩායම - රාජ්‍ය අංශයේ උසස් කළමනාකරණ මට්ටමේ නිලධාරීන්
- ❖ සහභාගිවූ සංඛ්‍යාව - 16 දෙනෙක්
- ❖ කාල පරිච්ඡේදය - 2019 අප්‍රේල් 1 දින සිට 5 දින දක්වා
- ❖ පැවැත්වූ රට - පිලිපීනය





## 6.2 වෙරළබඩ ධීවර පවුල්, වාරකන් තුල කාලය ඵලදායී ලෙස යොදා ගැනීම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් භාවිතා වන ධීවර කර්මාන්ත අංශ දෙකක් වන්නේ සමුද්‍ර ධීවර කර්මාන්තය සහ මිරිදිය හා කෘෂි කාර්මික ධීවර කර්මාන්තයයි. සමුද්‍රීය ධීවර කර්මාන්ත උප අංශයෙහි ධීවරයින් 130,800 ක් පමණ නිරත වී සිටින අතර සමුද්‍ර ධීවර කර්මාන්ත අංශයේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් 60% ක් පමණ සපයනු ලබන්නේ වෙරළබඩ අංශයේ කටයුතු කරන ධීවරයන් වන අතර ඉතිරි 40% සපයනු ලබන්නේ අක් වෙරළ / ගැඹුරු මුහුදේ කටයුතු කරන ධීවරයින් විසිනි. වාරකන් කාලය තුළ, බොහෝ ධීවරයින් බහු දින බෝට්ටු වල කම්කරුවන් ලෙස රැකියාවක් සොයා ගැනීමට හෝ මත්ස්‍යයින් බහුල කාලය සහිත වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීමට නැඹුරු වෙති. සමහර විට ඔවුන් වියළි මත්ස්‍ය නිෂ්පාදනය ඇතුළු ධීවර කර්මාන්තය ආශ්‍රිත වේතන උපයන වෙනත් ක්‍රියාකාරකම් සොයා ගනිති. එබැවින් වෙරළබඩ ධීවර පවුල් සඳහා වාරකන් කාලය ඵලදායී ලෙස භාවිතා කිරීම ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට වාසියක් වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත ගැටලුව විසඳීම සඳහා ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයේ ධීවර පවුල් ඵලදායී ලෙස යොදා ගැනීමේ අරමුණින් පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGD) :**

2019 මාර්තු 18 වන දින පුත්තලම් දිස්ත්‍රික්කයේ උඩප්පුව සහ කන්දකුලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා දෙකක් පවත්වන ලද අතර, එක් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවක් 2019 ජුනි මස 23 වන දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ ද, තවත් සාකච්ඡාවක් 2019 ඔක්තෝබර් 4 වන දින අම්පාර දිස්ත්‍රික්කයේ ද පවත්වන ලදී. ධීවර පවුල් හා ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා සම්බන්ධ ප්‍රධාන ගැටළු ඉහත ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මගින් හඳුනා ගන්නා ලදී.

**ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවල සාරාංශය**

| වැඩසටහනේ ස්වරූපය | පැවැත්වූ ස්ථානය | දිස්ත්‍රික්කය | නිලධාරීන් සමඟ සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ඉ.ක.සා | උඩප්පුව | පුත්තලම | 23 |
| ඉ.ක.සා | කන්දකුලිය | | 28 |
| ඉ.ක.සා | කුඩාවැල්ල දකුණ | හම්බන්තොට | 10 |
| ඉ.ක.සා | කල්මුණේ | අම්පාර | 15 |

උඩප්පුවේ පැවැති ඉලක්කගත කණ්ඩායම් සාකච්ජාව





කන්දකුලියේ පැවැති ඉලක්කගත කණ්ඩායම් සාකච්ජාව



කුඩාවැල්ල-දකුණ පැවැති ඉලක්කගත කණ්ඩායම් සාකච්ජාව



**දැනුවත් කිරීමේ වැඩසටහන් :**

ධීවරයින්ගේ භාර්යාවන් සඳහා "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අවස්ථා සහ ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ දැනුම" සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටියේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ලේ දී ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, මහ බැංකුව, "මහීමා" පැළ තවාන සහ ශ්‍රී ලංකා SIYB සංගමය සමඟ එක්ව පිළිවෙලින් 2019 ජුලි 12 සහ 2019 නොවැම්බර් 26 දිනවල පවත්වන ලදී. ඉහත සාමාන්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් ලබා ගත හැකි ස්වයං රැකියා හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අවස්ථා සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුවත් කිරීමක් ලබා දුන් අතර ඔවුන්ගේ විශේෂිත පුහුණු අවශ්‍යතා ද හඳුනා ගන්නා ලදී.

**දැනුවත් කිරීමේ වැඩසටහන්වල සාරාංශය**

| ස්ථානය | දිස්ත්‍රික්කය | නිලධාරීන් සමඟ සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රා.ලේ. කාර්යාලය- කල්පිටිය | පුත්තලම | 348 (නිලධාරීන් හැර) |
| ප්‍රා.ලේ.කාර්යාලය- තංගල්ල | හම්බන්තොට | 104 (නිලධාරීන් හැර) |

**ධීවර ප්‍රජාව සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන- කල්පිටිය ප්‍රා.ලේ. කාර්යාලය**





**ධීවර ප්‍රජාව සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන - තංගල්ල ප්‍රා.ලේ. කාර්යාලය**





**පුහුණු වැඩසටහන පැවැත්වීම:**

"කෝමාරිකා වගාව" පිළිබඳ පුහුණු වැඩසටහනක් 2019 ඔක්තෝබර් 18 වන දින කල්පිටියේ ප්‍රා.ලේ. කාර්යාලයේ දී ධීවර කාන්තාවන් 110 දෙනෙකු සඳහා ලංකා වාණිජ මණ්ඩලයෙහි සහයෝගීතාව ඇතිව සාර්ථකව පවත්වන ලදී. කල්පිටිය ධීවර කාන්තාවන්ගේ නිශ්චිතව හඳුනාගෙන ඇති පුහුණු අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රදේශයට වඩාත් ගැලපෙන පුහුණුව මත පදනම්ව පුහුණු වැඩසටහන් පවත්වන ලදී.





**කල්පිටියේ ප්‍රා.ලේ. කාර්යාලයේ දී පැවැත්වූ "කෝමාරිකා වගාව" පිළිබඳ පුහුණු වැඩසටහන**

### 6.3 පාසල්වල වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන

සිසුන් සමඟ වෘත්තීය සංවාද පැවැත්විය යුතු ආකාරය පිළිබඳව ගුරුවරුන් පුහුණු කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව විසින් පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන මඟින් වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ සවිස්තරාත්මක විශේෂඥ උපදේශනයක් සහ වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා ප්‍රායෝගික මග පෙන්වීම පිළිබඳ විශේෂඥ උපදේශනයක් සපයයි. දේශන කාර්යක්ෂමව ඉදිරිපත් කිරීමේ අරමුණින්, දේශන පැවැත්වීම පිණිස තාක්ෂණික ඇගයීම් කමිටුවක් හරහා කථිකාචාර්යවරුන්ගේ සංචිතයක් තෝරා ගන්නා ලදී.

- වෘත්තීය මාර්ගෝපදේශනයේ දී ගුරුවරයාගේ කාර්යභාරය
- මනෝමිතික හා වෘත්තීය පරීක්ෂණ
- පාසල් පද්ධතිය තුළ වෘත්තීය මාර්ගෝපදේශනය වැඩි දියුණු කිරීම
- ශ්‍රම වෙළඳපොළ, වෘත්තීය අධ්‍යාපනය, පුහුණුව සහ වර්තමාන පුහුණු අවස්ථා

සම්පත්දායකයින්ගේ සංචිතය විශේෂඥයින්ගෙන් සමන්විත වේ. එනම් වශයෙන් ගත්කළ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරිනී චන්දිමා රොද්‍රිගෝ මිය, රජරට විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරි ජේ. ඩී. රත්නායක මහතා, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ වැඩබලන අධ්‍යක්ෂ මංජුල විදානපතිරණ මහතා, ශ්‍රී ලංකා වෘත්තීය මාර්ගෝපදේශ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අජිත් ජයවර්ධන මහතා, කින්නියා ජාතික තරුණ බලකා පුහුණු මධ්‍යස්ථානයේ වෘත්තීය මාර්ගෝපදේශ උපදේශක පී. විවේකානාදන් මහතා, තරුණ සංවිධාන සංවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන සහකාර අධ්‍යක්ෂ(NYSC), බී.ඩී.ඩබ්ලිව්.කේ කරුණාරත්න මහතා ඇතුළත් වේ.

ඉහත සඳහන් සම්පත්දායකයින්ට අමතරව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අධ්‍යක්ෂ, ආචාර්ය කේ. ඒ. ලලිතධීර මයා "ශ්‍රම වෙළඳපොළ, ප්‍රවණතා සහ නායකත්වය" පිළිබඳ දේශන පැවැත්වී ය.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධ්‍යාපන කලාප නම් කරන ලදී. නම් කරන ලද කලාප වලට අමතරව බියගම මධ්‍යම විද්‍යාලයේ විදුහල්පතිගේ ඉල්ලීම පරිදි එක් අමතර වැඩසටහනක් පවත්වන ලදී. 2019 වර්ෂය සඳහා පවත්වන ලද වැඩසටහන් වලට අදාළ තොරතුරු පහත වගුව මගින් දැක්වේ.

| | අධ්‍යාපන කලාපය | පැවැත්වූ ස්ථානය | දිනය | සහභාගී වූ ගුරුවරුන් / විදුහල්පතිවරුන් / නිලධාරීන් |
|---|---|---|---|---|
| 1 | රත්නපුර | කුරුවිට අධ්‍යාපන ප්‍රාදේශීය කාර්යාලය | 2019 මාර්තු 22 | ගුරුවරු 110 |
| 2 | වැල්ලවාය | මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාව | 2019 මැයි 24 | ගුරුවරු 120 |
| 3 | බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල අධ්‍යාපන මධ්‍යස්ථානයේ සම්පත් මධ්‍යස්ථානය | 2019 ජූලි 24 | ගුරුවරු 110 |
| 4 | හොරණ | හොරණ තක්ෂිලා ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රධාන ශාලාව | 2019 සැප්. 9 | ගුරුවරු 90 |
| 5 | අම්පාර | ඩී. එස්. සේනානායක විද්‍යාලීය ශ්‍රවණාගාරය | 2019 ඔක්තෝබර් 4 | ගුරුවරු 110 |
| 6 | කටුගස්තොට | නුගවෙල මධ්‍ය විද්‍යාලීය ප්‍රධාන ශාලාව (ප්‍රාථමික) | 2019 ඔක්. 15 | ගුරුවරු 100 |
| 7 | බියගම මධ්‍ය විද්‍යාලය | බියගම මධ්‍ය මහා විද්‍යාලීය ප්‍රධාන ශාලාව | 2019 ජූනි 15 | ගුරුවරු 115 |
| මුළු සහභාගීත්වය | | | | **755** |

ගුරුවරුන්ගෙන් බහුතරයක් ඉල්ලීම වූයේ ගුරුවරුන් හා සිසුන් යන දෙපිරිසටම වරප්‍රසාද ලැබෙන පරිදි මෙම වැඩසටහන පාසැල් මට්ටමින් සංවිධානය කරන ලෙසයි. ඊට අමතරව, සියලුම දේශන ඵලදායී හා සාර්ථක එකක් වූ බව ඔවුන්ගේ මතය විය.

සහභාගිවූවන්ගේ අදහස් හා ප්‍රතිපෝෂණ මෙන්ම මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ කණ්ඩායම් නිරීක්ෂණ මත පදනම්ව, පාසල් පද්ධතිය තුළ වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- ❖ දිවයින පුරා ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශ අංශය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවකි.
- ❖ එම අධ්‍යාපන කලාපයේ ඕනෑම පාසලකට වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන සේවාව ලබා ගැනීම සඳහා කලාප / පාසල් වශයෙන් කමිටු පිහිටුවීම නිර්දේශ කරනු ලැබූ අතර එම කමිටුවට පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විම.
    - ➢ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන මානව සම්පත් සංවර්ධන නිලධාරීන්
    - ➢ නිපුණතා සංවර්ධන නිලධාරීන්
    - ➢ ගුරු උපදේශන මධ්‍යස්ථාන නියෝජනය කරන වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරු
    - ➢ වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතන (VTA, NAITA, DTET, NYSC)

❖ සිසුන්ගේ අධ්‍යාපන හා වෘත්තීය වරණයන්හි වෘත්තීය මාර්ගෝපදේශනය වැඩි දියුණු කිරීම සඳහා සැම පාසලකම වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන සැසි පැවැත්වීම

❖ පාසල්වලට වෘත්තීය නායකයින් සිටිය යුතුය. (එය විදුහල්පති, උප විදුහල්පති හෝ ක්‍රියාකාරී මට්ටමේ ගුරුවරයෙකු විය හැකි ය).

❖ 9 ශ්‍රේණියේ සැම සිසුවෙකුම වෘත්තීය පරීක්ෂණ සිදු කළ යුතු අතර ඔවුන්ගේ වාර්තා ඔවුන් සමඟ තිබිම.

❖ සියලුම අධ්‍යාපන අංශ ආවරණය වන පරිදි ගුරුවරුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන දැනුවත් කිරීම සහ පෙළඹවීමේ වැඩසටහන් සංවිධානය කිරීම නිර්දේශ කිරීම. (සැම පාසලකම විදුහල්පති සමඟ ගුරුවරුන් දෙදෙනෙකු / තිදෙනෙකු සහභාගී විය යුතුය)

❖ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ නිර්දේශයන්ට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

❖ කලාප අධ්‍යාපන කාර්යාල හොඳ වෘත්තීය මාර්ගෝපදේශන අධීක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම

❖ සියලුම අවශ්‍ය සහ අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරමින් සැම පාසලක් සඳහාම නිසි වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් පිහිටුවීම දැඩි ලෙස නිර්දේශ කරනු ලබන අතර ඒවා, ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය, වෘත්තීය තොරතුරු අත් පොත් සහ පත්‍රිකා සහ වෘත්තීය කුසලතා පොත් එකතුවකින් සමන්විත යුතු ය.

❖ සැම ඒකකයකටම 9 වන ශ්‍රේණියේ හෝ ඊට වැඩි සිසුන් සඳහා වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ හා වෙනත් පහසුකම් තිබිය යුතු ය.

❖ වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම සඳහා සුදුසු පරිසරයක් පාසල් තුළ තිබිය යුතුය. පාසලේ සැම අංශයක්ම වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළ අභිප්‍රේරණ පෝස්ටර් සහ බැනර් ප්‍රදර්ශනය කළ යුතුය.



## පාසල් වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීමේ වැඩසටහනක්

"පාසල් වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම" යන තේමාව පදනම් කර ගනිමින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, අධ්‍යාපන අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව පාසල් වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබන අතර, එහි 2019 ප්‍රථම පියවර ලෙස පාසලේ ගුරුවරුන් දැනුවත් කිරීම සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 මාර්තු මස 22 දින කුරුවිට අධ්‍යාපන කොට්ඨාස කාර්යාලයේදී සාර්ථක ලෙස පවත්වන ලදී. රත්නපුර අධ්‍යාපන කොට්ඨාශයේ ගුරුවරුන් 110ක් පමණ මෙම වැඩසටහනට සහභාගී වූහ.

එම වැඩසටහන සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයේ වෘත්තීය පුහුණු නිලධාරිනී, චන්දිමා රොද්‍රිගෝ මහත්මිය, රජරට විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක ජේ ඩී රත්නායක මහතා, කැලණිය විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය කුශාන් ගයත්‍රි පෙරේරා මහතා සහ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ අධ්‍යක්ෂක ආචාර්ය කේ ඒ ලලිතධීර මහතා ඇතුළු විද්වත් දේශක මඩුල්ලක් සහභාගී විය.

ඉතා සාර්ථක ලෙස පවත්වනු ලැබූ මෙම වැඩමුළුව පිළිබඳව ගුරුවරුන් ඉතා යහපත් ප්‍රතිචාර දැක්වූ අතර මෙවැනි වැඩසටහන් මාලාවක් ඉදිරියේදී දිවයිනපුරා පිහිටි තෝරාගත් පාසල්වල පැවැත්වීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව කටයුතු සංවිධානය කරමින් සිටී.

ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED.



පාසල් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන

"පාසල් තුළ වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීම" යන තේමාව පදනම් කර ගනිමින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශයේ මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, අධ්‍යාපන අමාත්‍යංශය සමඟ ඒකාබද්ධව පාසල් වෘත්තීය මාර්ගෝපදේශනය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබන අතර, එහි 2019දෙවන පියවර ලෙස පාසල තුළ ගුරුවරුන් දැනුවත් කිරීම සහ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2019 මැයි මස 24 දින තුළ වැල්ලවාය මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථක ලෙස පවත්වන ලදී. වැල්ලවාය අධ්‍යාපන කොට්ඨාසයේ ගුරුවරුන් 120ක් පමණ මේ වැඩසටහනට සහභාගී වූහ.

එම වැඩසටහන සඳහා විද්වත් දේශක මඬුල්ලක් සහභාගී විය. ඉතා සාර්ථක ලෙස පවත්වනු ලැබූ මේ වැඩමුළුව පිළිබඳ ගුරුවරුන් ඉතා යහපත් ප්‍රතිචාර දැක්වූ අතර මෙවැනි වැඩසටහන් මාලාවක් ඉදිරියේදී දිවයින පුරා පිහිටි තෝරාගත් පාසල් තුළ පැවැත්වීමට මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව කටයුතු සංවිධානය කරමින් සිටී.



## 6.4 රැකියා අරුණ වෘත්තීය ප්‍රදර්ශනය සහ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන

තීරණාත්මක වර්ධක කර්මාන්ත සඳහා නව කුසලතා ආකර්ෂණය කර ගැනීම පිණිස පුහුණු හා නුපුහුණු තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් රැකියා අරුණ වැඩසටහන පවත්වන ලදී. සෑම වසරකම සිසුන්ගෙන් 47% ක් පමණ සාමාන්‍ය අධ්‍යාපනයෙන් සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතියෙන් ඉවත් වේ. මානව සම්පත් සමුළුව, කාර්මික සංසද, ප්‍රතිපත්ති සංවර්ධනය හා වෘත්තීය ප්‍රදර්ශන සහ වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් වැනි විසඳුම් තුළින් මානව සම්පත් සංවර්ධන සභාවේ වාර්ෂික ව්‍යාපෘති හරහා බොහෝ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. නිපුණතා ගොඩනැගීම, රැකියා සොයා ගැනීම සහ රැකියා අපේක්ෂිත තරුණයින් රැකියා වෙළඳපොළට ඇතුළත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගයෙන් වෘත්තීය වෙළඳපළ හා වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් සකස් කරන ලදී.

සමාගම්, පුහුණු සපයන්නන් සහ රැකියා සොයන්නන් අතර තොරතුරු හුවමාරු කර ගැනීම කෙරෙහි අවධානය යොමු විය. එය විවිධ සමාගම් තුළ වෘත්තීය අවස්ථා ගවේෂණය කිරීමේ ක්‍රමයකි. ආයතනික සීමාවාසික පුහුණුව, රැකියා ස්ථානගත කිරීම සහ වෘත්තීය තොරතුරු සඳහා තරුණ ප්‍රවේශය ඇති කිරීම සඳහා මෙම වෘත්තීය ප්‍රදර්ශන සංවිධානය කරන ලද අතර තරුණයින් සහ ආයතන අතර සබඳතා ගොඩනැගීමට ද එමගින් අවස්ථාව සැළසෙනු ඇත.

*අරමුණු:*

1) කර්මාන්ත / සමාගම්වල පවතින රැකියා අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පුහුණු ආයතනවල පවතින නිපුණතා පුහුණු පාඨමාලා පිළිබඳව දැනුවත් කිරීම සහ වෘත්තීය ප්‍රදර්ශන පැවැත්වීම.
2) සේවා යෝජකයන්හට ඔවුන්ව තරුණයින්හට හඳුන්වා දීමට අවස්ථාවක් ලබා දීම.
3) රැකියා අවස්ථා නොමැති තරුණ තරුණියන්ට කර්මාන්ත අවස්ථා පිළිබඳව දැනුවත් බවක් ලබාදීම.
4) සේවා යෝජකයින් සහ රැකියා සොයන්නන් සම්බන්ධ කිරීමට අවස්ථාවක් සැලසීම

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුව, ලංකා හාම්පුතුන්ගේ සංගමය, වාණිජ මණ්ඩලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විවිධ පසුබිම්වල කර්මාන්ත නියෝජිතයින් වන රෙදිපිළි හා ඇඟලුම්, මෝටර් රථ, හෝටල් සහ සංචාරක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉදිකිරීම්, ආහාර තාක්ෂණය සහ ඉලෙක්ට්‍රොනික හා විදුලි සන්දේශ ඉංජිනේරු වැනි බොහෝ පාර්ශවකරුවන් සමඟ මෙම වැඩසටහන් සංවිධානය කර ඇත.

**වැඩසටහනෙහි ප්‍රතිදානය :**

පහත දැක්වෙන දිස්ත්‍රික්කවල වෘත්තීය අභිප්‍රේරණ වැඩසටහන් සහ වෘත්තීය ප්‍රදර්ශනය පැවැත්වූ අතර 6550 කට වැඩි පිරිසක් සහභාගී වූහ. එම වැඩසටහන් සඳහා සමාගම් 20 කට වැඩි ප්‍රමාණයක් සහ පුහුණු ආයතන 18 ක් සහභාගී වූහ.
මෙම වැඩසටහනේ පාර්ශවකරුවන් වූයේ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය, ජාතික වාණිජ මණ්ඩලය, බෙරෙන්ඩිනා සහ ඕස්ට්‍රේලියන් ඒඩ්ස්, මිනිස් බලශක්ති දෙපාර්තමේන්තුව සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම ය.

වෘත්තීය ප්‍රදර්ශන වැඩසටහන් වල සාරාංශය

| අංකය | දිස්ත්‍රික්කය / විශ්ව විද්‍යාලය | සහභාගිවූ සංඛ්‍යාව | ලබාගත් පුහුණුවීම් සංඛ්‍යාව | ලබාගත් රැකියා ප්‍රමාණය | පැවැත්වූ වෘත්තීය පරීක්ෂණ ගණන | සමාගම්/ පුහුණු ආයතනවල සහභාගිත්වය |
|---|---|---|---|---|---|---|
| 1 | නැගෙනහිර විශ්ව විද්‍යාලය | 2000 | 586 | 42 | 320 | 38 |
| 2 | රුහුණු විශ්ව විද්‍යාලය | 1500 | 337 | 525 | 270 | 42 |
| 3 | කළුතර | 1300 | 256 | 198 | 160 | 63 |
| 4 | සබරගමුව විශ්ව විද්‍යාලය | 1100 | 232 | 229 | 310 | 15 |
| 5 | ගාල්ල | 650 | 129 | - | - | 07 |
| | **එකතුව** | **6550** | **1536** | **994** | **1060** | **165** |

ලඟාකරගත් අරමුණු

- සිසුන් හා තරුණයින් රැකියා වෙළඳපොළට නිරාවරණය කිරීම.
- අනාගත අපේක්ෂා සහිත සිසුන්, තරුණයින් සහ අනාගත සේවා යෝජකයින් අතර ජාලකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීම.
- සැබෑ සම්මුඛ සාකච්ඡාවන්හි අත්දැකීම් ලැබීමට සිසුන්ට සහ තරුණයින්ට ඉඩ ප්‍රස්ථා ලබාදීම.
- සේවා යෝජකයින්ට සහ ව්‍යාපෘති අනුග්‍රාහකයන්ට තරුණයින්ගේ සහ ශිෂ්‍යයන්ගේ කුසලතා සහ නිපුණතා පෙන්වීම.
- තරුණ තරුණියන්හට සහ සිසුන්හට රැකියා ලබා ගැනීමේ අවස්ථා පුළුල් කිරීම
- වෘත්තීය හැකියාවන් ගොඩනැඟීම කෙරෙහි තරුණයින්ගේ උනන්දුව ඇතිකරලීම

### 6. 4.1 28/02/2019 දින නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පැවැති රැකියා අරුණ වැඩසටහන -

Graduate profiles launching



Career Motivation



Career path & job opportunities for future ready work force Panel Discussion






Career fair & Job Fair launching





### 6.4.2 12/09/2019 දින රුහුණු විශ්ව විද්‍යාලයේ පැවැති රැකියා අරුණ වැඩසටහන -

Career fair Inaugural event






Career fair Motivational Session






Career Fair





පාසැල් සිසුන් සඳහා වෘත්තීය ලැදියා පරීක්ෂණය සහ වෘත්තීය උපදේශනය ලබා දීම



**6.4.3 07/09/2019** දින කළුතර පැවැති රැකියා අරුණ වැඩසටහන **-**




**6.4.4 10/12/2019** දින සබරගමුව විශ්ව විද්‍යාලයේ පැවැති රැකියා අරුණ වැඩසටහන –





**6.4.5 17/12/2019 දින ගාලු දිස්ත්‍රික්කයේ පැවැති රැකියා අරුණ වැඩසටහන**





**වැඩසටහන සඳහා සම්බන්ධ වූ ආයතන -**




## 6.5. කාන්තාවන් සවිබල ගැන්වීම

**කාන්තා අධ්‍යක්ෂවරුන්ගේ සංසදය (WDF)**


කාන්තා අධ්‍යක්ෂවරුන්ගේ සංසදය යනු ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) පුරෝගාමී වැඩසටහනක් වන අතර එය ශ්‍රී ලංකාවේ කාන්තා අධ්‍යක්ෂකවරුන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවීම සහ ලැයිස්තුගත, ලැයිස්තුගත නොකළ, රාජ්‍ය හා පෞද්ගලික සංස්ථා ආස්ථිතීන්හි දිගුකාලීන කාන්තා නායකත්ව ඉලක්කයක් සහතික කිරීම ය.

**අරමුණු:**

- ❖ සියලුම කර්මාන්ත අංශයන්හි මණ්ඩලවල කාන්තාවන්ගේ ප්‍රගතිය වේගවත් කිරීම
- ❖ මණ්ඩල ක්‍රියාදාමයන් සහ භාවිතයන් සම්බන්ධයෙන් සහ මණ්ඩල සාමාජිකයන් වශයෙන් ස්වකීය ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සහ තම කාර්යභාරයන් සහ වගකීම් පිළිබඳ කාන්තා මණ්ඩල අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම
- ❖ මනා ආයතනික පරිචයට අදාළ පාලන, නියාමන, මූල්‍ය, නව කළමනාකරණ දර්ශන, තොරතුරු තාක්‍ෂණය සහ වෙනත් විෂය පථයන් ආශ්‍රිත දැනුම පිළිබඳ විශේෂඥයින් වෙතින් ඉගෙන ගැනීමට හා ඔවුන් සමඟින් සම්බන්ධ වීමට කාන්තා මණ්ඩල අධ්‍යක්ෂවරුන්ට සහාය වීම.
- ❖ එකිනෙකාගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට, අධ්‍යයනය කිරීමට මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී ස්වකීය කාර්යභාරය ඉටු කිරීමේ දී තමා මුහුණ දෙන ගැටළු සහ ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කිරීමට කාන්තා මණ්ඩල අධ්‍යක්ෂවරුන්ට සහාය වීම.
- ❖ ශක්තිමත් කාන්තා නායකත්ව කුසලතා සම්බන්ධ දිගුකාලීන ඉලක්කයක් තැනීමට සහාය වීම.



## 7. 2019 වසර තුළදී මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ සිදුකරන ලද පර්යේෂණ වාර්තා හා ප්‍රකාශන




**සංඛ්‍යාන අත්පොත 2019**

# 8. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනට**

| | සටහන | 2019 | 2018 | ශ්‍රී.ලං.රු. අයවැයගත |
|---|---|---|---|---|
| ***වත්කම්*** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | 1 | 17,297,237.12 | 19,867,509.10 | 20,150,000.00 |
| ලැබීම් | 2 | 40,062.82 | 40,062.82 | 41,000.00 |
| භාණ්ඩ තොග | 3 | 679,542.34 | 697,344.32 | 700,000.00 |
| පෙර ගෙවීම් | 4 | 270,413.02 | 278,423.21 | 280,000.00 |
| අනෙකුත් ජංගම වත්කම් | 5 | 3,271,452.39 | 2,999,024.93 | 23,010,000.00 |
| | | **21,558,707.69** | **23,882,364.38** | **24,181,000.00** |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| යටිතල පහසුකම්, පිරියත හා උපකරණ | 6 | 11,680,620.89 | 13,590,726.07 | 12,000,000.00 |
| මෝටර් රථ | 6 | 4,450,549.22 | 6,486,611.88 | 5,800,000.00 |
| අනෙකුත් වත්කම් | 6 | 531,137.56 | 455,327.29 | 410,000.00 |
| | | 16,662,307.67 | 20,532,665.24 | 18,210,000.00 |
| **මුළු වත්කම්** | | **38,221,015.36** | **44,415,029.62** | **42,391,000.00** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවීමට ඇති | 7 | 970,682.65 | 1,214,467.12 | 1,172,438.00 |
| කෙටි කාලීන වෙන්කිරීම් | 8 | 890,292.82 | 483,242.82 | 687,080.00 |
| | | **1,860,975.47** | **1,697,709.94** | **1,859,518.00** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| සේවක ප්‍රතිලාභ | 9 | 3,323,854.88 | 2,500,934.50 | 3,000,000.00 |
| | | **3,323,854.88** | **2,500,934.50** | **13,490,249.80** |
| **මුළු වගකීම්** | | **5,184,830.35** | **4,198,644.44** | **12,000,000.00** |
| **ශුද්ධ වත්කම්** | | **33,036,185.01** | **40,216,385.18** | **37,531,482.00** |
| **ශුද්ධ වත්කම් /ස්කන්ධය** | | | | |

| | | | |
|---|---|---|---|
| **දායකත්ව ප්‍රාග්ධනය** | | | |
| **දායකකළ ප්‍රාග්ධනය** | 3,000,000.00 | 3,000,000.00 | 3,000,000.00 |
| ප්‍රත්‍යාගණන සංචිත | 13,490,249.80 | 13,490,249.80 | 13,490,249.80 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 10,073,045.52 | 15,780,100.38 | 12,000,000.00 |
| සමුච්චිත අතිරික්තය/(ඌනය) | 6,472,889.69 | 7,946,035.00 | 9,041,232.20 |
| **මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය** | 33,036,185.01 | 40,216,385.18 | 37,531,482.00 |

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

දිනය:

සභාපති

දිනය:

## 9. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | *සටහන* | **2019** | **2018** | *ශ්‍රී.ලං.රු.*<br>*අයවැයගත* |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 23,408,216.00 | 23,999,900.00 | 24,000,000.00 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | 11,957,054.86 | 10,346,423.51 | 20,400,000.00 |
| වෙනත් ප්‍රදාන | 12 | (671,900.07) | 8,126,660.41 | 2,000,000.00 |
| වත්කම් බැහැරකිරීමෙන් ලාභ | 13 | (2,740.00) | (177,460.76) | - |
| අනෙක් ආදායම | 14 | 501,760.20 | 645,671.10 | 700,000.00 |
| **මුළු ආදායම** | | **35,192,390.99** | **42,941,194.26** | **47,100,000.00** |
| **වියදම්** | | | | |
| පඩිනඩි, වැටුප් හා සේවක ප්‍රතිලාභ | 15 | 18,907,777.29 | 17,582,539.74 | 17,897,970.00 |
| ප්‍රදාන හා අනෙක් මාරුකළ ගෙවීම් | 16 | 6,775,338.37 | 9,048,188.32 | 18,670,000.00 |
| සැපයුම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 17 | 673,257.71 | 795,776.53 | 1,345,000.00 |
| ක්ෂය කිරීමේ හා ක්‍රමක්ෂය වියදම | 6 | 5,181,716.49 | 4,101,234.63 | 4,000,000.00 |
| ගමන් වියදම්, යැපීම් හා දීමනා | 18 | 332,197.20 | 295,358.10 | 348,000.00 |
| උපයෝගිතා සහ සේවා | 19 | 3,557,029.81 | 4,006,597.44 | 3,587,100.00 |
| නඩත්තු වියදම් | 20 | 959,740.60 | 1,050,436.19 | 742,000.00 |
| අනෙකුත් වියදම් | 21 | 657,588.83 | 465,016.60 | 80,000.00 |
| **මුලු වියදම්** | | **37,044,646.30** | **37,345,147.55** | **46,670,070.00** |
| **කාලච්ඡේදය සඳහා අතිරික්තය /(හිඟය)** | | **(1,852,255.31)** | **5,596,046.71** | **429,930.00** |

## 10. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ස්කන්ධය තුළ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| පාලන ආයතනයේ හිමිකරුවන්ට බෙදීයාම | | | | | |
|---|---|---|---|---|---|
| | **දායක ප්‍රාග්ධනය** | **ප්‍රත්‍යාගණන සංචිත** | **රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය** | **සමුච්චිත අතිරික්තය/ (හිඟය)** | **මුළු ශුද්ධ වත්කම/ස්කන්ධය** |
| 2018 ජනවාරි 01 දිනට ප/ගේ ශේෂය | 3,000,000.00 | 13,490,249.80 | 14,636,523.89 | 2,349,988.29 | 33,476,761.98 |
| බැහැරකළ වත්කම් මත ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - |
| රජයේ ප්‍රදාන - ආදායම වෙත මාරු කිරීම | - | - | (6,071,874.88) | - | (6,071,874.88) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය/හිඟය/ අතිරික්තය තුළ ඍජුවම හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 11,490,000.00 | - | 11,490,000.00 |
| ප්‍රත්‍යාගණනය කළ වත්කම් මත පෙර ප්‍රත්‍යාගණන අතිරික්තය හඳුනා නොගැනීම | - | - | - | - | - |
| විලම්භිත ආදායම | - | - | (4,274,548.63) | - | (4,274,548.63) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිගය | - | - | - | 5,596,046.71 | 5,596,046.71 |
| කාලපරිච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම සහ වියදම් | - | - | 1,143,576.49 | 5,596,046.71 | 6,739,623.20 |
| **2018 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **3,000,000.00** | **13,490,249.80** | **15,780,100.38** | **7,946,035.00** | **40,216,385.18** |
| 2019 ජනවාරි 01 දිනට ප/ගේ ශේෂය | 3,000,000,.00 | 13,490,249.80 | 15,780,100.38 | 7,946,035.00 | 40,216,385.18 |
| පෙර වසරේ ගැලපීම | - | - | - | 379,110.00 | 379,110.00 |
| බැහැරකළ වත්කම් මත ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - |
| රජයේ ප්‍රදාන - ආදායම වෙත මාරු කිරීම | - | - | (6,775,338.37) | - | (6,775,338.37) |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වත්කම්/ ස්කන්ධය/හිඟය/ අතිරික්තය තුළ ඍජුවම හඳුනාගත් ශුද්ධ ආදායම | - | - | 6,250,000.00 | - | 6,250,000.00 |
| විලම්භිත ආදායම | - | - | (5,181,716.49) | - | (5,181,716.49) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිගය | - | - | - | (1,852,255.31) | (1,852,255.31) |
| කාලපරිච්ඡේදය සඳහා මුළු හඳුනාගත් ආදායම සහ වියදම් | - | - | (5,707,054.86) | (1,473,145.31) | (7,180,200.17) |
| **2019 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **3,000,000.00** | **13,490,249.80** | **10,073,045.52** | **6,472,889.69** | **33,036,185.01** |

## 11. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2019 | 2018 |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | |
| අතිරික්තය/ (හිඟය) | (1,852,255.31) | 5,596,046.71 |
| <u>මුදල් නොවන චලනයන්</u> | | |
| ක්ෂයකිරීම | 5,181,716.49 | 4,101,234.63 |
| පාරිතෝෂිත වියදම් | 919,607.88 | 728,819.75 |
| පෙර වසරේ ගැලපීම | - | - |
| විලම්භිත ආදායම | (5,181,716.49) | (4,274,548.63) |
| වසර අග වෙන්කිරීම් | - | - |
| සේවක ණය මත පොළී | (129,504.85) | (119,097.10) |
| විගණන ගාස්තුව | 438,150.00 | 397,200.00 |
| වත්කම් කපා හැරීම් | 155,039.13 | - |
| දේපල, පිරියත හා උපකරණ අලෙවිය මත (ලාභ)/අලාභ | 2,740.00 | 177,460.76 |
| පරිභෝජන ගබඩාව තුළ වැඩිවීම් (අඩුවීම්) | (17,801.98) | (77,373.47) |
| පෙර ගෙවුම්වල වැඩිවීම් (අඩුවීම්) | 8,010.19 | (114,007.30) |
| සේවක ණයවල වැඩිවීම් (අඩුවීම්) | (272,747.46) | (170,705.17) |
| අනෙකුත් අත්තිකාරම්වල වැඩිවීම් (අඩුවීම්) | (1,250.00) | 1,250.00 |
| ගෙවීමට ඇති දෑ හි වැඩිවීම් (අඩුවීම්) | (243,784.47) | 22,380.80 |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම් (අඩුවීම්) | - | 15,000.00 |
| ලැබීම්වල වැඩිවීම් (අඩුවීම්) | - | 31,100.00 |
| මිලදී ගත් වත්කම් ලැබීම්වල වැඩිවීම් (අඩුවීම්) | 1,570.00 | - |
| ගෙවූ විගණන ගාස්තුව | - | (227,700.00) |
| ගෙවන ලද පාරිතෝෂික | (96,687.50) | (217,975.00) |
| රජයේ ප්‍රදාන | (489,734.41) | 5,418,125.12 |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(1,578,648.78)** | **11,287,211.10** |

**ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ**

| | | |
|---|---|---|
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | - | (1,450.00) |
| පරිගණක මිලදී ගැනීම | - | (44,700.00) |
| මෝටර්රථ මිලදී ගැනීම | (807,442.85) | - |
| සේවක ණය මත පොළිය | 129,504.85 | 119,097.10 |
| මෘදුකාංග මිලදී ගැනීම | | - |
| පොත් මිලදී ගැනීම | (33,245.20) | (15,344.00) |
| වෙනත් වත්කම් මිලදී ගැනීම | (219,900.00) | (45,00.00) |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | 4,460.00 | 2,050.00 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(991,623.20)** | **14,653.10** |

**මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ**

| | | |
|---|---|---|
| මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ | **-** | **-** |
| මුදල් හා මුදලට සමාන දෑ තුළ ශුද්ධ වැඩිවීම් (අඩුවීම්) | (2,570,271.98) | 11,301,864.20 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | 19,867,509.10 | 8,565,644.90 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ | **17,297,237.12** | **19,867,509.10** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන්**

අතැති මුදල් සහ බැංකු සමග ශේෂ

| | | |
|---|---|---|
| ලංකා බැංකු ගිණුම 165197 | 17,252,519.88 | 19,725,532.37 |
| මහජන බැංකු ගිණුම් අංකය 119100120409161 | 44,717.24 | 141,976.73 |
| | **17,297,237.12** | **19,867,509.10** |

## 12. සටහන්

| | | 2019 | 2018 | අයවැයගත |
|---|---|---|---|---|
| **මුදල් හා මුදලට සමාන දෑ** | **1** | | | |
| ලංකා බැංකු ගිණුම 165197 | | 17,252,519.88 | 19,725,532.37 | 20,000,000.00 |
| මහජන බැංකු ගිණුම් අංකය 119100120409161 | | 44,717.24 | 141,976.73 | 150,000.00 |
| | | **17,297,237.12** | **19,867,509.10** | **20,150,000.00** |
| **ලැබිය යුතු** | **2** | | | |
| නිමල් බොපගේ (හිටපු සභාපති) | | 40,062.82 | 40,062.82 | 41,000.00 |
| | | 40,062.82 | 40,062.82 | **41,000.00** |
| **භාණ්ඩ තොග** | **3** | | | |
| පරිභෝජන භාණ්ඩ ගබඩා | | 679,542.34 | 697,344.32 | 700,000.00 |
| | | 679,542.34 | 697,344.32 | **700,000.00** |
| **පෙරගෙවීම්** | **4** | | | |
| රථවාහන රක්ෂණය | | 270,413.02 | **278,423.21** | 280,000.00 |
| | | **270,413.02** | **278,423.21** | **280,000.00** |
| **වෙනත් ජංගම වත්කම්** | **5** | | | |
| කාර්ය මණ්ඩල ණය - ආපදා | | 3,255,327.39 | 2,982,579.93 | 3,000,000.00 |
| උත්සව අත්තිකාරම් | | 10,000.00 | 8,750.00 | 10,000.00 |
| වත්කම් ගැණුම්කරුවන්ගෙන් ලැබිය යුතු | | 6,125.00 | 7,695.00 | - |
| | | **3,271,452.39** | **2,999,024.93** | **3,010,000.00** |

**දේපල, පිරියත හා උපකරණ (සටහන 06)**

| | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | | කාර්යාල උපකරණ | | විදුලිමය සවිකිරීම් | | පරිගණක | | මෘදුකාංග | | මෝටර් රථ | | පොත් | | වෙනත් වත්කම් | | ගොඩනැගිලි හා ව්‍යුහ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාර්තා කරන කාලය 2019.01.01 සිට 2019.12.31 දක්වා | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2019 | 2019 | 2018 |
| ආරම්භක ශේෂය | 4,964,689.09 | 4,964,689.09 | 3,315,328.99 | 3,378,042.99 | 66,135.25 | 66,135.25 | 5,683,496.72 | 5,718,212.98 | 776,556.61 | 776,556.61 | 14,200,000.0 | 14,200,000 | 83,779.34 | 127,659.99 | 1,015,778.3 | 1,077,505.8 | 6,531,265.68 | 6,531,265.68 |
| එකතු කිරීම් | - | - | - | 1,450.00 | - | - | - | 44,700.00 | 65,000.00 | - | 807,442.85 | - | 33,245.20 | 15,344.00 | 219,900.00 | 45,000.00 | - | - |
| ගැලපීම් | (80,431.60) | - | (142,780.19) | - | (44,056.25) | - | (13,907.00) | - | 348,010.00 | - | - | - | - | - | (132,576.0 | - | - | - |
| බැහැරකිරීම් | - | - | (16,000.00)) | (64,164.00) | (7,500.00) | - | - | (79,416.26) | - | - | - | - | - | (59,224.65) | - | (106,727.50 | - | - |
| අවසාන ශේෂය | 4,884,257.49 | 4,964,689.09 | 3,156,548.80 | 3,315,328.99 | 14,579.00 | 66,135.25 | 5,669,589.72 | 5,683,496.72 | 1,189,566.6 | 776,556.61 | 15,007,442.85 | 14,200,000.0 | 117,024.5 | 83,779.34 | 1,103,102.3 | 1,015,778.3 | 6,531,265.68 | 6,531,265.68 - |
| සමුච්චිත ක්ෂයකිරීම (වසර ආරම්භයේදී) | 1,251,204.40 | 752,404.93 | 1,769,551.78 | 1,462,128.39 | 36,157.93 | 33,242.13 | 3,583,133.49 | 3,602,513.59 | 776,556.61 | 775,839.49 | 7,713,388.12 | 4,873,388.12 | 28,411.47 | 81,311.82 | 615,818.88 | 541,049.51 | 330,142.06 | 3,578.78 |
| ගැලපිම | (59,323.88) | - | (108,592.50) | - | (19,910.53) | - | (8,876.00) | - | - | - | - | - | - | - | (62,009.00) | - | - | - |
| ක්ෂයකිරීම (මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය පරිදි) | 490,756.93 | 498,799.47 | 326,940.29 | 339,065.39 | 2,915.80 | 2,915.80 | 995,910.08 | 1,199.90 | 88,356.67 | 717.12 | 2,843,505.15 | 2,840,000.00 | 8,336.98 | 6,324.30 | 98,430.95 | 85,649.37 | 326,563.28 | 326,563.28 |
| අඩුකළා බැහැරකිරීම මත සමුච්චිත ක්ෂයකිරීම | - | - | (8,800.00) | (31,642.00) | (7,500.00) | - | - | (20,580.00) | - | - | - | - | - | (59,224.65) | - | (10,880.00) | - | - |
| ප්‍රත්‍යාගණන වත්කම් මත සමුච්චිත ක්ෂය කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අවසාන ශේෂය | 1,682,637.45 | 1,251,204.40 | 1,979,099.57 | 1,769,551.78 | 11,663.20 | 36,157.93 | 4,570,167.57 | 3,583,133.49 | 864,913.28 | 776,556.61 | 10,556,893.63 | 7,713,388.12 | 28,411.47 | 77,635.08 | 652,240.83 | 615,818.88 | 656,705.34 | 330,142.06 |
| ශුද්ධ ධාරණ අගය | 3,201,620.04 | 3,713,484.69 | 1,177,449.23 | 1,545,777.21 | 2,915.80 | 29,977.32 | 1,099,422.15 | 2,100,363.23 | 324,653.33 | - | 4,450,549.22 | 6,486,611.88 | 55,367.87 | 20,610.07 | 450,861.47 | 399,959.42 | 5,874,560.34 | 6,201,123.62 |

| | සටහන | 2019 | 2018 | අයවැයගත |
|---|---|---|---|---|
| <u>ගෙවිය යුතු</u> | **7** | | | |
| ශ්‍රම වෙළඳපළ සමීක්ෂණය | | - | 250,000.00 | 250,000.00 |
| ගොඩනැගිලි සහ රඳවාගැනීම් *Leema* | | 445,837.28 | 445,837.28 | 445,838.00 |
| දුරකථන | | 34,266.30 | 21,434.10 | 35,000.00 |
| අන්තර්ජාල පහසුකම් | | - | 13,690.00 | 14,000.00 |
| පුවත්පත් බිල | | - | 2,250.00 | 2,500.00 |
| සනිපාරක්ෂක හා ආරක්ෂාව | | 170,237.00 | 180,998.14 | 165,300.00 |
| වැටුප් | | 80,000.00 | - | - |
| අතිකාල | | 7,788.76 | 18,295.39 | 10,000.00 |
| ගමන් | | 350.00 | 2,100.00 | 1,000.00 |
| විදුලිය සහ ජලය | | 64,800.00 | 48,842.29 | 65,000.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම | | 36,936.00 | - | 40,000.00 |
| MCDP වැඩසටහන | | 27,600.00 | - | 30,000.00 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | | 17,079.33 | - | 20,000.00 |
| වැඩබැලීමේ වැටුප් | | - | 4,918.78 | - |
| අනෙකුත් අත්තිකාරම් | | - | 1.00 | - |
| නිපුණතා රාමුව | | - | 184,147.13 | - |
| රැකියා අරුණ | | 23,167.23 | 23,903.01 | 25,000.00 |
| මෝටර් රථ අළුත්වැඩියා සහ නඩත්තුව | | 4,720.00 | 11,500.00 | 5,000.00 |
| අනිකුත් | | 32,550,.75 | 3,750.00 | 35,000.00 |
| ධීවර වාරකන් කාලය | | 1,750.00 | - | 2,000.00 |
| සම්මන්ත්‍රණ සහ වැඩමුළු | | 22,000.00 | 2,800.00 | 25,000.00 |
| මුද්දර ගාස්තු | | 1,600.00 | - | 1,800.00 |
| | | **970,682.65** | **1,214,467.12** | **1,172,438.00** |
| | | | | |
| <u>කෙටි-කාලීන වෙන්කිරීම්</u> | **8** | | | |
| විගණන ගාස්තුව – 2014 | | 81,580.00 | 81,580.00 | 81,580.00 |
| විගණන ගාස්තුව – 2017 | | 221,490.00 | 80,500.00 | 80,500.00 |
| විගණන ගාස්තුව – 2018 | | 272,160.00 | 250,000.00 | 250,000.00 |
| විගණන ගාස්තුව - 2019 | | 275,000.00 | - | 275,000.00 |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම - එන්.බෝපගේ | | 40,062.82 | 71,162.82 | - |
| | | **3,323,854.88** | **483,242.82** | **687,080.00** |

| | *සටහන* | **2019** | | **2018** | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| සේවක ප්‍රතිලාභ | 9 | | | | | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | | 3,323,854.88 | | 2,500,934.50 | | 3,000,000.00 |
| | | | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 10 | 23,408,216.00 | | 23,999,900.00 | | 24,000,000.00 |
| | | | | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 11 | | | | | |
| රජයේ ප්‍රදාන - සංවර්ධන කටයුතු | | 6,775,338.37 | | 6,071,874.88 | | 18,670,000.00 |
| විලම්භිත ප්‍රදාන | | 5,181,716.49 | | 4,274548.63 | | 1,730,000.00 |
| | | 11,957,054.86 | | 10,346,423.51 | | 20,400,000.00 |
| | | | | | | |
| විදේශීය පුහුණු වැඩසටහන් මත ලාභය (අලාභය) | 12 | (671,900.07) | | 8,126,660.41 | | - |
| | | | | | | |
| වත්කම් බැහැර කිරීම මත ලාභය (අලාභය) | 13 | (2,740.00) | | (177,460.76) | | - |
| | | | | | | |
| වෙනත් ආදායම් | 14 | | | | | |
| විවිධ ආදායම් | | 372,255.35 | | 526,574.00 | | - |
| ආපදා ණය පොළී | | 129,504.85 | | 119,097.10 | | - |
| | | **501,760.20** | | **645,671.10** | | **-** |
| පඩිනඩි, වැටුප් සහ සේවක ප්‍රතිලාභ | 15 | | | | | |
| වැටුප් හා පඩිනඩි | | 11,805,466.18 | | 10,398,615.57 | | 11,686,210.00 |
| වැඩ බැලීමේ වැටුප් | | 16,286.55 | | 30,566.70 | | - |
| ජීවන වියදම් දීමනාව | | 2,334,428.57 | | 2,371,485.16 | | 2,335,000.00 |
| අතුරු දීමනාව | | - | | 416,828.00 | | - |
| ගැලපුම් දීමනාව | | 177,633.00 | | 419,808.35 | | 178,000.00 |
| ප්‍රවාහන දීමනාව | | 600,000.00 | | 600,000.00 | | 600,000.00 |
| ඉන්ධන දීමනාව | | 436,755.00 | | 242,000.00 | | 453,970.00 |
| සේ.අ.අ | | 1,639,516.67 | | 1,449,631.62 | | 1,640,000.00 |
| සේ.භා.අ | | 409,789.53 | | 362,143.30 | | 410,000.00 |
| අතිකාල | | 223,761.47 | | 278,800.34 | | 248,790.00 |
| නිවාඩුදින ගෙවීම් | | 5,013.40 | | 7,440.95 | | 6,000.00 |
| වෘත්තීය දීමනාව | | 339,519.04 | | 276,400.00 | | 340,000.00 |
| පාරිතෝෂික වියදම් | | 919,607.88 | | 728,819.75 | | - |
| | | **18,907,777.29** | | **17,582,539.74** | | **17,897,970.00** |

| | සටහන | 2019 | | 2018 | | අයවැයගත |
|---|---|---|---|---|---|---|
| **ප්‍රදාන හා අනෙකුත් මාරුකිරීම් ගෙවීම** | **16** | | | | | |
| පුවත් ලිපිය | | 207,853.00 | | 16,500.00 | | 600,000.00 |
| dialog TVET සඳහා පහසුකම් සැපයීම | | 167,773.08 | | - | | 500,000.00 |
| මානව ප්‍රාග්ධන සම්මානය | | 17,906.77 | | - | | 200,000.00 |
| ජාතික මානව සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ පසු විපරම | | - | | 3,005.00 | | 50,000.00 |
| නිපුණතා රාමුව ක්‍රියාත්මක කිරීම | | 530,476.47 | | 1,681,989.85 | | 3,500,000.00 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සඳහා දක්ෂ සේවකයා | | - | | 358,868.36 | | - |
| මා.ස.සං.ශ්‍රී.ජා.සභාවේ කාර්ය මණ්ඩල අංශ ශක්තිමත් කිරීම | | 176,843.82 | | - | | 2,000,000.00 |
| ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කමිටු නිර්දේශ | | 98,472.80 | | - | | 400,000.00 |
| සංඛ්‍යාන අත්පොත | | - | | 111,500.00 | | - |
| දේශන මාලාව | | 301,006.00 | | - | | 1,000,000.00 |
| අධ්‍යක්ෂවරුන්ගේ අත්පොත (KPMG) | | 54,578.24 | | 282,330.00 | | 1,300,000.00 |
| ISO | | 7,600.00 | | - | | 20,000.00 |
| නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත කො.කො.හුවමාරුව සමඟ කටයුතු කිරීම | | - | | 22,676.00 | | - |
| වාර්ෂික පුහුණු පරතරය | | 31,050.00 | | 34,912.00 | | 850,000.00 |
| පුහුණු විදේශීය ශ්‍රමිකයන් | | - | | 143,304.00 | | 800,000.00 |
| රැකියා අරුණ | | 1,971,464.23 | | 2,094,125.88 | | 2,000,000.00 |
| කුඩා ව්‍යාපාර අංශය ශක්තිමත් කිරීම | | - | | 220,643.20 | | 500,000.00 |
| අයවැය යෝජනාව | | - | | 226,683.20 | | - |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | | 1,207,894.45 | | 522,849.97 | | 3,000,000.00 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා MCDP වැඩසටහන | | - | | 852,357.99 | | - |
| මොඩියුල සංවර්ධනය කිරීම | | - | | 254,207.98 | | - |
| තත්ත්ව පරාමිතීන් වැඩි දියුණු කිරීම | | - | | 309,390.08 | | - |
| තත්ත්ව හා ඵලදායිතාව | | - | | 68,592.25 | | - |
| නිපුණතා දත්ත පද්ධතිය | | - | | 36,906.04 | | - |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | 523,740.12 | | 254,994.00 | | 1,000,000.00 |
| යෝජනාව ඇගයීම | | - | | 2,025.00 | | - |
| සම්මන්ත්‍රණ වැඩමුළුව | | 692,664.19 | | 1,550,327.52 | | - |
| ධීවර වාරකන් සමය | | 408,803.06 | | - | | 200,000.00 |
| කම්කරු ප්‍රතිසංස්කරණ | | 177,124.00 | | - | | 580,000.00 |
| උපදේශනයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ධාරිතාව | | 185,188.14 | | - | | - |
| කම්කරු සංක්‍රමණය | | 14,900.00 | | - | | - |
| පුස්තකාලය වැඩි දියුණු කිරීම | | - | | - | | 170,000.00 |
| | | **6,775,338.37** | | **9,048,188.32** | | **18,670,000.00** |

| | Note | 2019 | | 2018 | | Budgeted |
|---|---|---|---|---|---|---|
| සැපයීම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 17 | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | 154,317.98 | | 120,016.53 | | 320,000.00 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | | 518,939.73 | | 675,760.00 | | 1,025,000.00 |
| | | 673,257.71 | | 795,776.53 | | 1,345,000.00 |
| ක්ෂය කිරීම හා ක්‍රමක්ෂය වියදම් | 6 | 5,181,716.49 | | 4,101,234.63 | | 4,000,000.00 |
| ගමන් වියදම්, යැපීම් හා දීමනා | 18 | | | | | |
| දේශීය ගමන් වියදම් හා යැපීම් දීමනාව | | 34,597.20 | | 18,308.10 | | 38,000.00 |
| විගණන සාමාජිකයින් සඳහා දීමනාව | | 45,600.00 | | 48,000.00 | | 50,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දීමනාව | | 252,000.00 | | 228,000.00 | | 260,000.00 |
| විදේශ සංචාර සහ යැපීම් | | - | | 1,050.00 | | - |
| | | 332,197.20 | | 295,358.10 | | 348,000.00 |
| උපයෝගිතා සහ සේවා | 19 | | | | | |
| වරිපනම් | | 50,400.00 | | 40,320.00 | | 50,400.00 |
| විදුලිය | | 557,384.80 | | 679,893.63 | | 697,000.00 |
| ජලය | | 25,113.40 | | 39,432.30 | | - |
| දුරකථන ගාස්තුව හා කුලිය | | 342,413.02 | | 420,754.22 | | 363,000.00 |
| තැපැල් ගාස්තු හා ටෙලෙක්ස් ගාස්තු | | 9,275.00 | | 8,375.00 | | - |
| සනීපාරක්ෂක සේවය | | 543,220.50 | | 502,182.97 | | 452,700.00 |
| ප්‍රචාරණය | | - | | 95,565.00 | | - |
| ආරක්ෂක සේවය | | 1,617,989.74 | | 1,433,154.90 | | 1,357,300.00 |
| අන්තර්ජාල පහසුකම් | | 144,642.45 | | 150,590.00 | | 145,000.00 |
| වෙනත් උපයෝගිතා හා වෙනත් සේවා | | 266,590.90 | | 636,329.42 | | 521,700.00 |
| | | 3,557,029.81 | | 4,06,597.44 | | 3,587,100.00 |
| නඩත්තු වියදම් | 20 | | | | | |
| මෝටර් රථ අළුත්වැඩියා සහ නඩත්තුව | | 304,614.94 | | - | | 520,000.00 |
| රථවාහන රක්ෂණය | | 418,138.52 | | 737,038.51 | | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා සහ නඩත්තුව | | 172,781.74 | | 198,426.69 | | 146,000.00 |
| පරිගණක අළුත්වැඩියා සහ නඩත්තුව | | 9,600.00 | | 24,725.00 | | - |
| වෙනත් වත්කම් අළුත්වැඩියා සහ නඩත්තුව | | 54,605.40 | | 90,245.99 | | 76,000.00 |
| | | 959,740.60 | | 1,050,436.19 | | 742,000.00 |
| වෙනත් වියදම් | 21 | | | | | |
| විගණක ගාස්තුව | | 438,150.00 | | 397,200.00 | | - |
| පුවත්පත් සහ වාර ප්‍රකාශන | | - | | 2,250.00 | | - |
| සංග්‍රහ කිරීම් | | 64,399.70 | | 65,566.60 | | 80,000.00 |
| වත්කම් කපාහැරීම් | | 155,039.13 | | - | | - |
| | | **657,588.83** | | **465,016.60** | | **80,000.00** |

## 13. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් විස්තරාත්මක සටහන්වල සාරාංශයකින් සමන්විත සටහන්

**1.** මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව 1997 අංක 18 දරණ පනතින් පිහිටුවනු ලැබිය. ආයතනයට පවරණ ලද බලතල යටතේ, මානව සම්පත් සංවර්ධනයට අදාළ සියලුම කටයුතු සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදේ.

**2. මූල්‍ය ප්‍රකාශ නිකුත්කිරීම සඳහා ගිණුම් පවත්වා ගැනීම සහ බලයදීම**

මූල්‍ය පනතේ (1971 අංක 38) 14 වගන්තිය අනුව, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව රාජ්‍ය ආයතනයක් ලෙස, එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම, මුදාහැරීම සහ කාර්යසාධනය පිළිබඳ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් සකස් කරනු ලැබේ. එකී වාර්තාවේ වසර තුළ සභාව වෙත අදාළ අමාත්‍යාංශය විසින් දෙනු ලබන උපදෙස් දක්වා ඇත. එකී වාර්තාවේ පිටපත් අදාළ අමාත්‍යාංශයට සහ මුදල් අමාත්‍යාංශයට (නියමිත අමාත්‍යාංශය නොවේනම්), සැලසුම් කිරීමේ අමාත්‍යාංශයට හා විගණකාධිපති වෙත එම වසර අවසාන වී මාස හතරක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය පනතේ (1971 අංක 38) 14 වගන්තිය අනුව,එක් එක් මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ආයතනයක ගිණුම් එම වසර අවසාන වීමෙන් පසු මාස හතරක් ඇතුළත විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කිරීමේදී ඔහු විසින් නියම කරනු ලබන ආකාරයෙන් ගිණුම් පිළිබඳ වාර්තා ද ඉදිරිපත් කළ යුතුය. මෙම උප වගන්තියේ දක්වා ඇති විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූල වීමට නොහැකිවන යම් ආයතනයක් මෙම පනත යටතේ වැරදිකරුවෙක් වන අතර, මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ කෙටි පරීක්ෂණයකින් පසු වැරදිකරු කිරීම මත රුපියල් දහස නොඉක්මවන දඩයකට යටත් කරනු ලැබේ.

***3.*** **අනුකූලතා ප්‍රකාශය**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කරනු ලබයි.

**4. ඇගයීමේ පදනම්**

ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, විදුලිමය සවිකිරීම් හා උපකරණ, පරිගණක, මෝටර් රථ සහ අනෙකුත් වත්කම් සඳහා පිලිවෙලින් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව සහ ස්වාධින තක්සේරුකරුවන් විසින් 2008, 2011, 2014 සහ 2016 වසර තුළ සිදුකරන ලද ප්‍රත්‍යාගණනය සඳහා හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පරිවර්තනය යටතේ සකස් කෙරේ.

## 5. වත්කම් ඇගයීමේ පදනම්

**5.1** දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයකිරීම අඩුකළ පිරිවැයට/වටිනාකමට සඳහන් කරනු ලබයි.

**5.2** සියලුම දේපල, පිරියත හා උපකරණ සඳහා වියදම් කිරීමට සිදුවන කාලීන අයකිරීම් මඟින් ස්ථාවර වත්කම්වල තක්සේරු කළ ඵලදායි ජීව කාලය පුරා ඒවායේ පිරිවැය ක්‍රමානුකූලව බෙදී යන පරිදි අයකරනු ලැබේ.

**5.3** මිලදීගත් වසර තුළ කිසිදු ක්ෂයකිරීමක් වෙන් කරනු නොලබන අතර 2009 වසරට පෙර මිලදීගත් වත්කම් සඳහා බැහැර කරන වසර තුළ සම්පූර්ණ වසරේ ක්ෂයකිරීම වෙන් කරන අතර 2009 සිට ඉදිරියට එක් එක් වත්කම් මිලදී ගත් දිනය/බැහැර කරන දිනය මත පදනම් වී ක්ෂයකිරීම ගණනය කරනු ලැබේ.

**5.4** පරිභෝජන භාණ්ඩ තොග පිරිවැයේ අවමයට හා ශුද්ධ උපලබ්ධිකළ හැකි වටිනාකමට අගයනු ලබයි.

## 6. ක්ෂයකිරීම

වත්කම් පන්ති හා ක්ෂයකිරීමේ අනුපාත පහත පරිදි වේ. වත්කම් පන්ති ඒවායේ ස්වභාවය හා ආයතනය විසින් ඒවායේ භාවිතය අනුව තීරණය කෙරේ.

| | |
|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහ | 5% |
| ලිබඩු හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10% |
| විදුලිමය සවිකිරීම් හා උපකරණ | 20% |
| පරිගණක | 20% |
| පරිගණක මෘදුකාංග | 25% |
| මෝටර් වාහන | 20% |
| පොත් | 10% |
| වෙනත් වත්කම් | 10% |

## 7. වාර්තාකරන දිනයෙන් පසු සිදුවීම්

සියලුම වැදගත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලනු ලබන අතර අනාවරණය කළ යුතු සුදුසු ගැලපීම් මූල්‍ය ප්‍රකාශ තුල සිදුකරනු ලැබ ඇත. පරිශ්‍රයේ නවීකරණ කටයුතු 2017 ජනවාරි ආරම්භ කළ අතර දෙසැම්බර් මසදී අවසන් කරන ලදි. ලීමා ඉදිකිරීම් සමාගමට ගෙවිය යුතු රඳවාගැනීමේ මුදල ශේෂ පත්‍රය තුළ ගෙවිය යුතු වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර අනුරූප වත්කම් ගොඩනැගිලි හා ව්‍යුහ යටතේ හඳුනා ගනු ලැබීය.

## 8. වත්කම් මාරු කිරීම

ලිබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ වැනි වත්කම් හා අනෙකුත් වත්කම් නවීකරණය හේතු කොට ගෙන බැහැර කර ඇත. මෙම වත්කම් පුහුණු මධ්‍යස්ථානවල භාවිතා කිරීම සඳහා වෘත්තිය පුහුණු අධිකාරිය වෙත මාරු කර ඇත. ඉහත වත්කම් මාරුකිරීම සඳහා අවශ්‍ය අනුමැතින් අමාත්‍යාංශයෙන් ලබාගන්නා ලදි.

## 9. රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

මහා භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සපුරාලීමට භාවිතා කෙරේ. පර්යේෂණ හා සංවර්ධන කටයුතු (NHRDC කටයුතු) සඳහා දරණ ලද මුදලක් සහ වසර තුළ අයකළ ක්ෂයකිරීමට සමාන මුදලක් ප්‍රාග්ධන වත්කම්වල ඵලදායි ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ලෙස හඳුනාගනී.

## 10. විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

### 10.1 නිර්ණය කළ දායක සැලැස්ම - සේ.අ.අ- සේ.නි.භා.අ

සේවක අර්ථසාධක අරමුදල (E.P.F) සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදල (E.T.F) සඳහා සුදුසුකම් ලබන සියලූම සේවකයින් අදාළ ව්‍යවස්ථාපිත සහ රෙගුලාසි සමඟ අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ. සියලූම දායක මුදල් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදල් පනතේ නියමයන් හා රෙගුලාසි අනුව සේ.අ.අ සහ සේ.නි.භා.අරමුදලට ප්‍රේෂණය කරන ලදි.

### 10.2 විශ්‍රාම පාරිතෝෂික

සියලුම සේවකයින් සඳහා ‘‘සේවක ප්‍රතිලාභ’’ පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු වන විශ්‍රාම පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි වෙන්කිරීම් සිදු කෙරේ. පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් ලබා නොගන්නා අතරම අයුගණකව ඇගයීම් සිදුකර නොමැත.

## 11. මූල්‍ය කාර්ය සාධනය

මෙහෙයුම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තුව තුළ දරණ ලද සියලූම පිරිවැය ආදායමට අයකරනු ලැබ ඇත. ආදායම හා වියදම්වල හිඟය/ අතිරික්තය සියලූම දැනුවත් වගකීම් සහ වත්කම් ක්ෂයකිරීම සඳහා වෙන්කිරීම් සිදුකිරීමෙන් පසු ගණනය කර ඇත.

**12. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 27 වගන්තියේ දක්වා ඇති පරිදි වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලබයි.

**13. අමාත්‍යාංශය විසින් පවරනු ලබන මෝටර් රථ**

වාහන අංකය WP- PD 6170 හා චැසි අංකය JNICJUD22Z0116541 දරන වාහනය 2016.02.01 දින සිට තාවකාලික පදනමක් මත NHRDC වෙත ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් වෙන්කරනු ලැබ ඇත.

## 14.විගණන විමසුම් හා පිළිතුරු

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } VTY/D/NHRDC/01/19/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 දෙසැම්බර් 23

සභාපති,
මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 01 හි 99 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියලුම ආදායම් සහ වියදම් අයිතම ලාභ හෝ අලාභවල ඇතුළත් කළ යුතු වුවත්, සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන විදේශ පුහුණු වැඩසටහන් වෙනුවෙන් ලද රු. 14,693,000 ක ආදායම සහ ඉන් දරන ලද රු.15,364,900 ක වියදම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

කිරීමකින් තොරව රු. 671,900 ක ශුද්ධ අගය පමණක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් යටතේ සෘණ අගයක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ වෙනම දැක්විය යුතු වුවද ශුද්ධ වටිනාකම රු. 324,653 ක් වූ පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂයකදී උපදේශකවරයෙකුට ගෙවීම වෙනුවෙන් වෙන්කරන ලද රු. 250,000 ක මුදල අතීතානුයෝගීව ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම සහ විදේශ පුහුණු වැඩසටහනක් වෙනුවෙන් භාහිර ආයතන දෙකකින් ලබාගත් රු. 900,000 ක මුදල අදාල වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම නිසා ගෙවිය යුතු වියදම් ලෙස දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 1,150,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයතුළ දී ගෙවන ලද රු. 96,687 ක්වූ පාරිතෝෂික මුදල පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට හර කිරීම වෙනුවට වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික ප්‍රතිපාදනය විගණනයේ ගණනය කිරීම් අනුව රු. 2,999,559 ක් වුවද ආයතනයේ ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. 3,227,167 ක් වූයෙන් රු. 227,608 ක අධි වෙන්කිරීමක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ දී නිකුත් කරන ලද රු.130,000 ක් වූ චෙක්පත වර්ෂය තුළදීම අවලංගු වී තිබුණ ද එම වගකීම නැවත ගිණුම්වල දක්වා නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ස්ථාවර වත්කම් වටිනාකම විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන සමඟ සැසඳීමේදී වත්කම් වර්ග තුනකට අදාළව එකතුව රු.910,285 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර,එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

  හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැරයම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 අගෝස්තු 10 දින දක්වා ප්‍රමාද වී තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**03. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභා පනතේ 16 (2) (ඊ) ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය සහ ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමේ බලතල සභාව සතු වුවත් සභාවේ අරමුණු ඉටුකර ගැනීමට පහසුවන පරිදි අවශ්‍ය තොරතුරු ඇතුලත් යාවත්කාලීන වූ දත්ත බැංකුවක් පවත්වාගෙන යාමට සමාලොචිත වර්ෂය නිමවන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) විදේශීය පුහුණු වැඩ සටහන් සඳහා ලැබී තිබූ මුදලින් රු. 456,201 ක් විධිමත් අනුමැතියකින් තොරව ඉන් පරිබාහිර කාර්යයන් සඳහා වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 413,751 ක් වූ වත්කම්වල වටිනාකම විධිමත් අනුමැතියකින් තොරව පොත්වලින් කපා හැර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවෙහි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

(අ) 2020 වර්ෂයේදී ගිණුම් ප්‍රමිතියට අනුකූලව සටහනක් ලෙස ගිණුම් ප්‍රකාශ වල ඉදිරිපත් කරන ලදී.

(ආ) 2020 ගිණුම් ප්‍රකාශ වල නිවැරදිව ඉදිරිපත් කරන ලදී.

(ඇ) බාහිර ආයතන වලින් ලබා ගත් මුදල් සියල්ල වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම නිසා ආපසු ගෙවා ඇත.

(ඇ) පාරිතෝෂික ගණනය කිරීමේදී ඇතිව තිබූ දෝෂය සොයා ගන්නා ලද අතර එය 2020 වර්ෂයේ සිට නිවැරදිව ගණනය කරන ලදී.

(ඉ) එම අවලංගු වූ චෙක්පතට නියමිත පරිදි ගෙවීම් සිදු කර ඇත.

(ඊ) ගිණුම්ගත කිරීමේදී සිදු වූ වරද නිවැරදි කරන ලද අතර ස්ථාවර වත්කම් පිළිබඳ ආගණනයක් සිදු කිරීමට අවශ්‍යව ඇත.

02 **<u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>**

ආයතනයට අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන ලද්දේ ජුනි මස බැවින් අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කරන ලදී.

03 **<u>වෙනත් නිරීක්ෂණ</u>**

(අ) දත්ත බැංකුවක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) ආයතනයේ වියදම් පියවීම සඳහා භාවිතා කල අතර 2020 වර්ෂයේ එසේ වියදම් නොකරන ලදී.

(ඇ) 2018 විගණන වාර්තාවේ සඳහන් කරන ලද දෝෂ/ වැරදි නිවැරදි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර පොදුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

ආචාර්ය කේ.ඒ. ලලිතධීර
අධ්‍යක්ෂ
සභාපති වෙනුවට